# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2017

විදේශ රැකියා අමාත්‍යාංශය
வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
Ministry of Foreign Employment

විදේශ රැකියා අමාත්‍යාංශය

# කාර්යසාධන වාර්තාව
# 2017

www.mfe.gov.lk

# පටුන


## දල විශ්ලේෂණය 1 - 10

- ශ්‍රම විගමනය පිළිබඳ ව්‍යුහාත්මක පිවිසුම ජාතික ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලැස්ම
- ජාත්‍යාන්තර සංදර්භය තුල ශ්‍රම විගමනය විධිමත් කිරීම - කලාපීය සංවාද හා ජාත්‍යාන්තර සංසඳ විගමනයෙහි වර්ධනය

## විදේශ රැකියා අමාත්‍යාංශය 11 - 21

දල විශ්ලේෂණය
දැක්ම, මෙහෙවර සහ සේවය සඳහා වු කැපවීම
අභ්‍යන්තර පරිපාලනය
මානව සම්පත් කළමණාකරනය
විගමනික ශ්‍රමිකයින් සවිබල ගැන්වීම සඳහා වු ප්‍රධාන උපාය මාර්ග
2017 වසරේ කලාපිය සංවාද හා ජාත්‍යාන්තර සංසද සඳහා දායක වීම

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 22 - 33

දැක්ම, මෙහෙවර සහ අරමුණු
ප්‍රධාන විෂයපථය හා කාර්යයන්
යහපාලනය සහ කර්මාන්තය නියාමනය කිරීම
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මානව සම්පත් සංවර්ධනය
විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල් වල සමාජිකයින් ආරක්ෂා කිරීම සහ සවිබල ගැන්වීම
සංවර්ධන කාර්ය භාරය සහ රැකියා සඳහා විගමනය සම්බන්ධ කිරීම
සේවයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම

## ශ්‍රී ලංකා වදේශ රැකියා ඒජන්සිය 34 - 40

හැඳින්වීම
දැක්ම, මෙහෙවර සහ අරමුණු
ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ ප්‍රධාන අංශයන්
ඉලක්ක සපුරා ගැනීම්

## ඇමුණුම් 121 - 125

අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය
අමාත්‍යාංශය සදහා අනුමත කාර්ය මණ්ඩලය
මුල්‍ය කාර්ය සාධනය
විදේශ රැකියා සඳහා පිටත්වීමේ විස්තරය

## 1. දල විශ්ලේෂණය

**විගමනය පිලිබදව ඓතිහාසික පදනම -** විගමනික චර්යා වඩවඩාත් ව්‍යාප්ත සහ ගෝලීයකරණය වීම හේතුවෙන් රජය අද වන විට විගමන කළමනාකරණය පිළිබඳ අභියෝග ගණනාවකට මුහුණ පා ඇත. 1965 දී, ලොව පුරා විගමනිකයන් සංඛ්‍යාව මිලියන 75කට ආසන්න විය. 2002 වසර වන විට එම සංඛ්‍යාව මිලියන 175 දක්වා වර්ධනය වී තිබේ. 1965 දී "ගමනාන්ත රටවල්" ලෙස හඳුනාගනු ලැබූයේ රටවල් ඉතා සුළු සංඛ්‍යාවකි. අද වන විට ලොව සෑම රටක්ම පාහේ යම් ප්‍රමාණයක විගමනිකයන් යවන, විගමනිකයන් ලබන හෝ ඔවුන්ගේ රටවල් වෙත ප්‍රවේශ වන ස්ථාන ඔස්සේ විගමනිකයන් ගමන් කරන තත්ත්වයට පත්ව තිබේ.එබැවින් ගමනාන්ත රටවල් වෙත විගමනය වීම මගින් බලපෑමට ලක්වූ රටවල් පිළිබඳ සම්ප්‍රදායික වර්ගීකරණය දැන් බොහෝ දුරට අර්ථ ශූන්‍ය වේ.

**මෑත කාලීන විගමනයෙහි ස්වරූපය -** රැකියා ප්‍රවර්ධනය, බඳවා ගැනීම සහ තෝරාගැනීම, බොහෝ මූල්‍යමය වාසි සලසන සංචාරක යෝජනාක්‍රම සහ ප්‍රවාහන පහසුකම් ඇතුලුව මෙම රටවල් කරා සිදුවන විගමන ක්‍රියාදාමයේ එක් එක් අංශවලට සහායවීම පිණිස "විගමන කර්මාන්තය" සංවර්ධනය කොට ඇත. ශ්‍රමිකයින් විගමනය කල පසු ඔවුන් පදිංචි කරවීම, අලුත් ජීවිතය සහ සේවා වටපිටාවට හුරු කරවීම සඳහා පහසුකම් සැපයීම පිණිස විශාල පිළිගැනීම් මධ්‍යස්ථාන ඉදිකර පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

1960 දශකයේ මැද භාගය වන විට, සංක්‍රමණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව පහත වැටීමට පටන් ගත් අතර යුරෝපීය නොවන රටවලින් අයදුම්පත්‍ර ලබා ගැනීමට ඉඩ සලසනු පිණිස තෝරාගැනීමේ නිර්ණායක ක්‍රමයෙන් සුදුසු පරිදි වෙනස් කරන ලදී.

1970 දශකයේ මැද භාගය වන විට, අයදුම්කරුවන්ගේ වාර්ගික සම්භවය පිළිබඳ අඩුවෙන් සහ විගමනිකයන්ගේ සුදුසුකම්, කුසලතා සහ සේවා පළපුරුද්ද වෙත වැඩියෙන් අවධානය යොමු වන ආකාරයෙන් විගමන වැඩසටහන්වල අරමුණු සකස් කරන ලදී.

ගමනාන්ත රටවල ජනවිකාශනය සහ සමාජ සංයුතිය සැලකිය යුතු ආකාරයකින් පරිණාමනයට ලක්ව ඇත. ජීවන රටාවන්, හර පද්ධතීන් ද සැලකිය යුතු වෙනස්කම්වලට භාජනය වූ බව නිසැකය. ආර්ථික අංශයෙන් ගත් කළ, තත්වයන් වඩා සියුම්ව වෙනස් වූවත්, මතයේ වැඩි බර නැඹුරු වූයේ ගමනාන්ත රටවල් ආර්ථික වර්ධනයෙන් ප්‍රතිලාභ ලැබූ බවටත් සම්භව රටවල් අතිරික්ත ශ්‍රමය විගමණය වීමෙන් මෙන්ම ඔවුන් විසින් එවනු ලැබූ ප්‍රේෂණ වලින් උපකාර ලබාගත් බවටත් වූ මතය කෙරෙහිය. අදාළ රටවල ආර්ථික සහ සමාජ ව්‍යුහය මත මෙම විගමන ගලනයේ සමස්ත බලපෑම සම්බන්ධයෙන් පසුකාලීනව බොහෝ වාද විවාද ඇති විය.

## 2. ශ්‍රම විගමනය සදහා වූ ව්‍යුහාත්මක පිවිසුම

### ජාතික ප්‍රතිපත්ති හඳුන්වා දීම හා ක්‍රියාකාරී සැලසුම්

**ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය:** ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය 2009 අප්‍රේල් මස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. (දකුණු ආසියාවේ ප්‍රථම වරට) වෙනත් රටවල රැකියාවල නිරතව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය ප්‍රකාශ වන පරිදි ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය විසින් වැඩි දියුණු කර සකස් කර ඇත. ශ්‍රම විගමනය පිළිබඳ මාර්ග සිතියමේ ප්‍රධාන අරමුණ වූයේ පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබාගැනීමේ ක්‍රියාවලියක් හරහා ජාතික ශ්‍රම විගමන ප්‍රතිපත්තිය සකස් කිරීම උදෙසා උපාය මාර්ගික දළ සැලැස්ම සකස්කිරීමයි.

ජාතික ශ්‍රම විගමන ප්‍රතිපත්තියට ප්‍රධාන අරමුණු 03 ක් පවතී.

1. සංක්‍රමණික ක්‍රියාවලිය යහපාලනය - විගමන ප්‍රතිපත්තිය සකස් කිරීමේදී සමාජ පාර්ශ්වකරුවන් සහ සිවිල් සමාජය සමග අදහස් විමසීමේ ක්‍රියාවලියක් මත පදනම්ව ශ්‍රම විගමනය වඩාත් හොඳින් පාලනය හා නියාමනය කිරීම

2. සංක්‍රමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල් වල ආරක්ෂාව බලසතු කිරීම හා රැකවරණය සැපයීම - විගමනික ශ්‍රමිකයන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට සඵලදායක ආරක්ෂාවක් හා සේවා සැපයීම

3. සංක්‍රමණය හා සංවර්ධන ක්‍රියාවලිය සම්බන්ධ කිරීම - ආපසු පැමිණෙන විගමනික ශ්‍රමිකයන් යළි සමාජගත කිරීම, ජාතික අවශ්‍යතාවයනට අනුව ප්‍රතිපත්ති ඇතිකිරීම හා ශ්‍රම සංචලනතාවයේ දායකත්වය සංවර්ධන අරමුණු කරා ඒකරාශි කිරීම

**ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන් සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ උප ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම - 2015**

නැවත පැමිණෙන ශ්‍රමිකයන් සමාජීය, ආර්ථික හා මානසික වශයෙන් සමාජගත කිරීමට මෙම ප්‍රතිපත්තිය තුළින් සම්මුතිවාදී ප්‍රවේශයක් ලබාගෙන ඇත. ශ්‍රමිකයා සමාජගත කිරීම, පිටත්ව යාමට පෙර අදියරේදී ආරම්භ වී විගමන චක්‍රය මුළුල්ලේම පැවතීම අවශ්‍යය බවද එහි විශේෂයෙන් දක්වා ඇත. මෙය දැනට පවතින ඉතුරුම් සහ ආයෝජන යෝජනාක්‍රම ණය හා ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් පිළිබඳ සමාලෝචනයක්ද වන අතර ආපසු පැමිණි විගමණිකයන්ගේ ව්‍යවසාය ඇතිකිරීම සහ ආර්ථික සවිබල ගැන්වීම ප්‍රවර්ධනය සඳහා දිරිගැන්වීම් ලබා දෙයි.

**ජාතික උපදේශන කමිටුව**

ශ්‍රම විගමනය පිළිබඳ ජාතික උපදේශන කමිටුව මගින් ජාතික ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් බලාත්මක කර තිබේ. ජාතික ප්‍රතිපත්තියේ උපදේශන කමිටුව ස්ථාපිත කිරීම විස්තර කරනුයේ “විගමනය හා සම්බන්ධ සියලු ප්‍රමුඛ රාජ්‍ය ආයතන සහ අනෙකුත් රජයේ සහ රාජ්‍ය නොවන ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත ශ්‍රම විගමනය පිළිබඳ උපදේශන කමිටුවක් ස්ථාපිත කිරීම” ලෙසය. උපදේශන කමිටුවේ නියෝජනය විදේශ රැකියා අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන ප්‍රධාන අමාත්‍යංශ නියෝජිතයන්ගෙන් සහ සේව්‍ය, වෘත්තිය සමිති, සිවිල් සමාජය සහ රැකියා සඳහා බඳවා ගැනීමේ කර්මාන්තයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

උපදේශන කමිටුවේ කාර්යභාරය වනුයේ ශ්‍රම විගමන ක්‍රියාදාමය සමාලෝචනය කිරීම, ගැටලු සහ අභියෝග ගවේෂණය කිරීම, ශ්‍රම වෙළඳපොළේ සිදුවන වෙනස්කම් සොයා බැලීම සහ ක්‍රියාදාමයේ සියලු අංශ පිළිබඳව උපදෙස් දීම වේ. ශ්‍රම විගමනය පිළිබඳ උපදේශන කමිටුවේ විධි නියෝගය, කාර්යභාරය සහ වගකීම් විස්තර කරමින්, යොමුකිරීම් විදේශ රැකියා අමාත්‍යාංශය සකස් කරනු ඇත.

## ශ්‍රම විගමනය හා ආශ්‍රිත ප්‍රතිපත්ති

- ශ්‍රී ලංකා සුනිසි රැකියා ප්‍රතිපත්තිය 2006
- ශ්‍රී ලංකාව සඳහා ජාතික මානව සම්පත් සහ රැකියා නියුක්ති ප්‍රතිපත්තිය, 2012
- ශ්‍රී ලංකා විගමන සෞඛ්‍යය ප්‍රතිපත්තිය, 2012
- ශ්‍රී ලංකාවේ මිනිස් වෙළඳාම මර්දනය කිරීම පිළිබඳ ජාතික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2015-2019
- ශ්‍රී ලංකාවේ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව පාදක ප්‍රචණ්ඩත්වයට පිළියම් යෙදීම පිණිස ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2016-2020
- ශ්‍රී ලංකා ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම 2017-2021

## 3. ජාත්‍යන්තර සංදර්භය තුළ ශ්‍රම විගමනය විධිමත් කිරීම.

### i. කලාපීය සංවාද

#### කොළඹ ක්‍රියාදාමය

කොළඹ ක්‍රියාදාමය යනු ආසියානු සම්භවයක් සහිත විදෙස්ගත ශ්‍රමිකයින් හා කොන්ත්‍රාත් ශ්‍රමිකයින් කළමනාකරණය සඳහා වූ කලාපීය උපදේශන ක්‍රියාදාමයකි. මෙය ශ්‍රම සංචලනය සම්බන්ධයෙන් පොදු උනන්දුව හා සැලකිල්ල පිළිබඳව සංවාදයක් හා සහයෝගිතාවක් සදහා පහසුකම් සපයන සාමාජිය රටවල් මගින් ක්‍රියාත්මක වන, නොබැඳි සහ අවිධිමත් සංසදයකි.

මෙහි පළමු රැස්වීම 2003 වසරේදි පැවැත්වූ පසු පසුගිය රැස්වීම් වලදි ගත් තිරණ ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා ඉදිරියේදි අවධානය යොමු විය යුතු අංශ හදුනා ගැනිම සදහාත් 2004, 2005, 2011 හා 2016 වසර වලදි මෙම ක්‍රියාදාමයේ රැස්වීම් පිළිවෙළින් මැනිලා, බාලි, ඩකා හා කොළඹ දී පවත්වන ලදි.

කොළඹ ක්‍රියාදාමයේ බාලි, ඩකා සහ 2016 වර්ෂයේ කොළඹදි පැවති අමාත්‍ය උපදේශාත්මක සමුළුව සදහා නැගෙනහිර ඇමෙරිකානු, යුරෝපය, ගල්ෆ් සහයෝගිතා රටවල්, අසියානු හා අබුඩාබි සංවාදයේ නියෝජිතයින් සහභාගි වි සාර්ථකත්වය ඉහළ දමන ලදි.

2014 වසරේ සිය සභාපතිත්වය යටතේ පැවති පළමු ජ්‍යෙෂ්ඨ නිලධාරී රැස්වීමේදී කොළඹ ක්‍රියාදාමය සඳහා උපායමාර්ගික දැක්මක් ශ්‍රී ලංකාව යෝජනා කරන ලද අතර පසුව එම රැස්වීමේදී සාමාජික රටවල් විසින් එය අනුමත කරන ලදී. උපායමාර්ගික දැක්ම සාක්ෂාත් කරගැනීමේදී අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර සහ තේමාත්මක ප්‍රමුඛතා පහක් ඒ සඳහා උපකාරී වි තිබේ.

2013 වසරේ එහි සභාපති පදවිය හිමිවීමේ සිට තේමාත්මක සහ ආයතනික මට්ටමේදී මෙන්ම සාමාජික රටවල සාමූහික ප්‍රයත්න හරහා අනෙකුත් සංවාද මණ්ඩප සමග සහයෝගිතාවය තුළින් ශ්‍රී ලංකාව දැනෙන ජයග්‍රහණ ගණනාවක් අත්කර ගත් අතර 2017 අප්‍රේල් මාසයේදී සභාපතිධුරය නේපාල රාජ්‍යයට බාර දෙන ලදී.



## අබුඩාබි සංවාදය

විගමනික ශ්‍රමය උත්පාදනය වන අසියානු හා ගමනාන්ත රටවල් අතර සහයෝගිතා හා සංවාදය සඳහා වූ සංසදයක් ලෙස අබුඩාබි සංවාදය 2008 වසරේදී ආරම්භ කරන ලදී. මෙම සංවාදය සඳහා කොළඹ ක්‍රියාදාමයේ සාමාජික රටවල් 11 ක් වන ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, නේපාලය, පකිස්තානය, පිලිපීනය, ශ්‍රී ලංකාව, තායිලන්තය හා වියට්නාමයද, ගමනාන්ත ගල්ෆ් රටවල් 6 ක් වූ බහරේන්, කුවේට්, ඕමාන්, කටාර්, සවුදි අරාබියාව මෙන්ම මැලේසියාව යන රටවල් ඇතුලත් වේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානය, ජාත්‍යන්තර විගමනික සංවිධානය, පුද්ගලික අංශය හා සිවිල් සමාජීය ආයතන මෙහි නිත්‍ය නිරීක්ෂකයින් ලෙස ක්‍රියා කරයි. මෙහි ස්ථිර ලේකම් හා පහසුකම් සැපයීම එක්සත් අරාබි එමීර් රාජ්‍ය විසින් දරණ අතර වර්තමානයේ සභාපති ධුරය ශ්‍රී ලංකාව විසින් උසුලයි.

රාජ්‍යයන් විසින් මෙහෙයවනු ලබන කලාපීය උපදේශන ක්‍රියාදාමයක් ලෙස අබුඩාබි සංවාදය මගින් ආරක්ෂිත, විධිමත් හා නිත්‍ය ශ්‍රමික සංක්‍රමන මාර්ග තුලින් සංක්‍රමන සඳහා ඉඩ සැලසීම ඉලක්ක කරයි. ශ්‍රම සංචලනය හා බැඳුණු වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා වාර්තා කිරීම සම්බන්ධ ඒකාබද්ධ සංවර්ධනයක් බහු පාර්ශවීය සංවාදයන් හා සහයෝගිතාවන් මත නිසි ක්‍රමවේදයන් යොදාගැනීම සහ එකිනෙකාගේ අත්දැකීම් මගින් දැනුම ලබාගැනීමට සහතික වීමට අබුඩාබි සංවාදය සහයෝගය ලබාදේ.

වර්තමානයේ ඉදිරිපත් කර ඇති මූලපිරීම් අනුව ගෝලීය සම්මුතියේ සන්දර්භය තුල පහත සඳහන් මූලපිරීම් සලකා බැලීමට අබුඩාබි සංවාදයේ සමාජිකයින් විසින් පහසුකම් සපයන්නන්ගේ අවධානයට යොමු කරනු ලැබේ.

- සේවා ගිවිසුමේදී ලබා දෙන කොන්දේසි හා ගමනාන්ත රටවලදී පිරිනමන කොන්දේසි අතර වූ පරස්පරතා හා කොන්ත්‍රාත් ආදේශනය අවම කිරීම සඳහා අදාල රාජ්‍යයන් විසින් ශ්‍රම සැපයුම් රාජ්‍යයන් හා ගමනාන්ත රජයන් අතර රැකියා කොන්දේසි හා කොන්ත්‍රාත් වලංගු කිරීම.




- ශ්‍රම සැපයුම් රටවල් හා ගමනාන්ත රටවල් අතර ජනතාවගේ සහසම්බන්ධතාව සඳහා අන්‍යෝන්‍ය වශයෙන් කුසලතා හදුනා ගැනීම සහ සහතික කිරීම.

- ශ්‍රම දායකත්වය ඉහල නංවා ගැනීම, ශ්‍රමික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා දැනුවත් කිරීම, ගමනාන්ත අතර පහසුවෙන් හුවමාරු වීම සඳහා විගමනික ශ්‍රමිකයින් හට පෙර විගමනික පුහුණු වැඩසටහන් හා පරිපූර්ණ තොරතුරු ලබා දීම.

- ගමනාන්ත රටවලදී ශ්‍රමිකයින් රැකියාව සඳහා බඳවා ගැනීම සහ යොමුකිරීමට රැකියා අයදුම්පත්‍ර සැකසීම හා අයදුම්පත්‍ර සඳහා අනුමැතිය ලබාදීම සඳහා ගමනාන්ත රටවල් හා සේවා සැපයුම් රටවල් අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ අන්තර්ජාල සහසුකම් සැපයීම.

## ii. ජාත්‍යාන්තර සංසද

### විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලිය සංසදය (GFMD)

විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලිය සංසදය ආරම්භ වු 2007 වසරේ සිට රජයන් අතර බහුමාන දැක්මකින් සාකච්චා කිරීමේ අවකාශයක් ලබා දෙමින්, විගමනය සම්බන්ධ අවස්ථාවන් හා අභියෝග සහ සංවර්ධනය සමග එහි අන්‍යෝන්‍ය සම්බන්ධතාවයද ඇතුලත්ව විගමනය හා සංවර්ධනය පිළිබඳව ගෝලිය කතිකාවක් ගොඩනැගිමට දායක විය. අවුරුදු ගණනාවක සිටම විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලිය සංසදය සංවේදි හා විටෙක මතභේදාත්මක කාරණා පිළිබඳව විවෘතව විශ්ලේෂණය කිරීම හා සාකච්ජා කිරීම, විවිධ තත්ත්වයන් පිළිබඳව සවන්දිම සහ සහක්‍රියාවන් ගවේෂණය කිරීම සහ හවුල්කාරිත්වය තුළින් ඒකාබද්ධ විසදුම්වලට එළඹිමට රජයන් වෙත අවස්ථාව ලබා දි ඇත. මෙම ක්‍රියාකාරිත්වය තුළ සංවර්ධනය හා විගමනය පිළිබඳව සංකිර්ණ සබදතාවය ගැඹුරින් අවබෝධකර ගැනිම සහ මෙම තිරණාත්මක කරුණ පිලිබදව පැහැදිලි, විෂයානුබද්ධ, තර්කාන්විත ගෝලිය කතිකාවක් ගොඩනැගිමට සහයෝගය ලබාදෙනු ඇත.

ජර්මනිය හා මොරොක්කෝව විසින් 2017 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 වන දින දක්වා සංක්‍රමණය හා සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදයේ සම සභාපතිත්වය දරයි. මෙම වසර දෙකේ කාලය තුළ විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලිය සංසදය එක්සත් ජාතීන්ගේ සංවිධානයට දායකත්වය ලබා දෙනු ඇත. 2018 දී රාජ්‍ය ප්‍රජාව විසින් අනුගමනය කළ යුතු වැඩි දියුණු කළ ගෝලීය සංක්‍රමණ ප්‍රතිපත්තියක් සඳහා අන්තර්ජාතික ප්‍රජාව වෙත ශක්තිමත් සංඥාවක් ලබා දිමට මෙම සංසදය අදහස් කරයි.

### සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලිය සම්මුතිය (GCM)

2016 සැප්තැම්බර් 19 වැනි දින, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සරණාගතයන් සහ සංක්‍රමණිකයන් සඳහා නිව්යෝක් ප්‍රකාශය සම්මත කරගන්නා ලද අතර ඒ හරහා එහි සාමාජික රටවල් 2018 වසරේදී සම්මත කරගැනීම පිණිස සුරක්ෂිත ක්‍රමවත් විධිමත් විගමණය සඳහා ගෝලිය සම්මුතියක් සකස් කිරිම සඳහා වූ බැඳීමක් ඇති කරගන්නා ලදී.

විගමනය පිළිබඳ ගෝලීය සම්මුතියක් සකස් කිරිම, ගෝලීය විගමන පාලනයට තීරණාත්මක දායකත්වයක් ලබාදීමේ අවස්ථාවක් ශ්‍රී ලංකාවට උදාකරයි. මානව හිතවාදීත්වය, සංවර්ධනය සහ මානව හිමිකම් ආශ්‍රිත මානයන් ඇතුළුව අන්තර්ජාතික විගමනයේ සියලු අංශ පිළිබඳ සාමාජික රටවල් අතර පොදු ප්‍රතිපත්ති, බැඳීම් සහ අවබෝධයන් ඒකාබද්ධ කරන්නා වූ රාමුවක් සැපයීම එමඟින් අපේක්ෂා කෙරේ. විගමන ගෝලීය සම්මුතිය පිළිබඳ නිව්යෝක් ප්‍රකාශයේ තේමාත්මක ක්ෂේත්‍ර හයක් අන්තර්ගත වන අතර සලකා බැලිම සඳහා මූලිකාංග 24ක් ලැයිස්තු ගත කරයි.

විගමනය සඳහා අන්තර්ජාතික සංවිධානයේ තාක්ෂණික සහාය සහ සංවර්ධන සහයෝගිතාව සඳහා ස්විස් නියෝජිතායතනයේ මූල්‍ය දායකත්වයෙන් විදේශ රැකියා අමාත්‍යාංශය ජාතික උපදේශනයට නායකත්වය ලබා දීමට මුලපුරා තිබේ.

ඒ පිළිබඳ වූ අවසන් වාර්තාව 2017 ඔක්තෝබර් 12 වනදා සම සභාපතිවරුන් වෙත ඉදිරිපත් කරනු ලැබීය.

## 4. විගමනයෙහි වර්ධනය

ශ්‍රී ලංකාව මැද පෙරදිග සහ අප්‍රිකානු ශ්‍රම වෙළඳපලට අවතීර්ණවීම, රටේ ආර්ථිකය හා සමාජ ජීවිතය යන දෙකම කෙරෙහි සාර්ව මෙන්ම සූක්ෂම මට්ටමේ බලපෑම් සහිතව සමස්ත විගමන කර්මාන්තයෙහිම සුවිශේෂී සංවර්ධනයක් සලකුනු කළ අතර පසුගිය දශක දෙකක පමණ කාලයක් තිස්සේ එහි විවිධ ධනාත්මක හා සෘණාත්මක මානයන් විවිධ පර්යේෂකයන් හා ප්‍රතිපත්ති සැලසුම්කරුවන් විසින් සාකච්ඡාවට භාජනය කර ඇත.

**විදේශ රැකියා සඳහා පිටත්වීම් 1987- 2017**

| වර්ෂය | පිරිමි | | ගැහුණු | | එකතුව |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය. | % | ප්‍රමාණය. | % | |
| 1987 | 10,647 | 75.37 | 3,480 | 24.63 | 14,157 |
| 1988 | 8,309 | 45.09 | 10,119 | 54.91 | 18,428 |
| 1989 | 8,680 | 35.11 | 16,044 | 64.89 | 24,724 |
| 1990 | 15,377 | 36.08 | 27,248 | 63.92 | 42,625 |
| 1991 | 21,423 | 32.97 | 43,560 | 67.03 | 64,983 |
| 1992 | 34,858 | 28.00 | 89,636 | 72.00 | 124,494 |
| 1993 | 32,269 | 25.00 | 96,807 | 75.00 | 129,076 |
| 1994 | 16,377 | 27.22 | 43,791 | 72.78 | 60,168 |
| 1995 | 46,021 | 26.68 | 126,468 | 73.32 | 172,489 |
| 1996 | 43,112 | 26.52 | 119,464 | 73.48 | 162,576 |
| 1997 | 37,552 | 24.99 | 112,731 | 75.01 | 150,283 |
| 1998 | 53,867 | 33.71 | 105,949 | 66.29 | 159,816 |
| 1999 | 63,720 | 35.45 | 116,015 | 64.55 | 179,735 |
| 2000 | 59,793 | 32.82 | 122,395 | 67.18 | 182,188 |
| 2001 | 59,807 | 32.50 | 124,200 | 67.50 | 184,007 |
| 2002 | 70,522 | 34.61 | 133,251 | 65.39 | 203,773 |
| 2003 | 74,508 | 35.51 | 135,338 | 64.49 | 209,846 |
| 2004 | 80,699 | 37.59 | 134,010 | 62.41 | 214,709 |
| 2005 | 93,896 | 40.60 | 137,394 | 59.40 | 231,290 |
| 2006 | 90,170 | 44.65 | 111,778 | 55.35 | 201,948 |
| 2007 | 103,476 | 47.37 | 114,983 | 52.63 | 218,459 |
| 2008 | 128,232 | 51.19 | 122,267 | 48.81 | 250,499 |
| 2009 | 119,381 | 48.31 | 127,745 | 51.69 | 247,126 |
| 2010 | 136,850 | 51.16 | 130,657 | 48.84 | 267,507 |
| 2011 | 136,307 | 51.84 | 126,654 | 48.16 | 262,961 |
| 2012 | 144,135 | 51.03 | 138,312 | 48.97 | 282,447 |
| 2013 | 175,185 | 59.75 | 118,033 | 40.25 | 293,218 |
| 2014 | 190,217 | 63.26 | 110,486 | 36.74 | 300,703 |
| 2015 | 172,788 | 65.58 | 90,655 | 34.41 | 263,443 |
| 2016 | 160,302 | 65.99 | 82,628 | 34.01 | 242,930 |
| 2017 | 139,271 | 65.64 | 72,891 | 34.36 | 212162 |

()




විදේශ රැකියා සදහා පිටත්වීම් වල කැපී පෙනෙන වර්ධනයක් 1987 වසරේ සිට 2014 වර්ෂය දක්වා පෙන්නුම් කරයි. 1987 වසරේදි 14,157 වු විදේශ රැකියා සදහා පිටත්වීම් 2014 වසර වන විට 300,703 දක්වා වර්ධනය වි ඇත. විදේශ රැකියා සදහා පිටත්වීම් තවදුරටත් විශ්ලේෂණ කිරිමේදි පෙනි යන්නේ එහි කාන්තා සහභාගිත්වය 1988 වර්ෂයේදී ප්‍රථම වරට පිරිමින්ගේ සංඛ්‍යාව අභිබවා ගිය අතර මෙම ප්‍රවණතාවය 2007 දක්වා පවත්වා ගෙන ඇති බවයි. ගෘහ අංශයේ රැකියා හා ඇඟලුම් කර්මාන්තශාලාවල රැකියා සඳහා විගමනය වූ වැඩි සංඛ්‍යාවක් කාන්තාවන් වීම, එම ප්‍රවණතාවට හේතුවිය. කෙසේ වෙතත් වසර 20 කට පසුව 2008 දී ඉතා පටු ආන්තිකයක් වන කාන්තාවන් 48.81 % කට පිරිමින් 51.19 % වශයෙන් පිරිමි ශ්‍රමිකයින් සංඛ්‍යාව කාන්තා ශ්‍රමිකයින් සංඛ්‍යාව අභිබවා ගොස් ඇත. 2010 වන විට පිරිමි විගමනය 51.16 % සහ කාන්තා විගමනය 48.84% වශයෙන් දැක්විය හැක.

2014 වර්ෂයේදී විදේශ රැකියා සඳහා ඉතා ඉහළම ශ්‍රමික සංඛ්‍යාවක් 300,703 පිටත්වු බවට වාර්තා වන අතර, ඒ අතුරින් 110,486 (36.74%) ක් කාන්තාවන්ද ,190,217 (63.26%) ක් පිරිමින්ද විය. නමුත් 2014 පසුව 2015 වර්ෂයේ සිට රැකියා සඳහා විගමනය විම කාන්තා හා පිරිමි යන අංශ දෙකෙන්ම පසුබෑමකට ලක්වී ඇත.

## විදේශ රැකියා සඳහා පිටත්වීම් 2016 හා 2017

| රට | පිරිමි | | | කාන්තා ගෘහ සේවිකා හැර | | | ගෘහ සේවිකා | | | එකතු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017* | % | 2016 | 2017* | % | 2016 | 2017* | % | 2016 | 2017* | % |
| සවුදි අරාබිය | 37,109 | 25,348 | -31.69 | 1,863 | 1,171 | -37.14 | 24,417 | 11,381 | -53.39 | 63,389 | 37,900 | -40.21 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 55,018 | 52,316 | -4.91 | 1,696 | 1,587 | -6.43 | 2,813 | 2,741 | -2.56 | 59,527 | 56,644 | -4.84 |
| බහරේන් | 26,932 | 24,106 | -10.49 | 5,451 | 5,302 | -2.73 | 7,741 | 7,249 | -6.36 | 40,124 | 36,657 | -8.64 |
| ඕමාන් | 13,074 | 12,170 | -6.91 | 1,562 | 1,595 | 2.11 | 17,779 | 23,655 | 33.05 | 32,415 | 37,420 | 15.44 |
| කුවේට් | 8,538 | 5,754 | -32.61 | 69 | 49 | -28.99 | 2 | 2 | 0.00 | 8,609 | 5,805 | -32.57 |
| කටාර් | 3,132 | 2,981 | -4.82 | 435 | 556 | 27.82 | 6,181 | 5,335 | -13.69 | 9,748 | 8,872 | -8.99 |
| ජෝර්දාන් | 5,757 | 5,907 | 2.61 | 211 | 244 | 15.64 | 155 | 128 | -17.42 | 6,123 | 6,279 | 2.55 |
| සිංගප්පූරුව | 1,393 | 1,486 | 6.68 | 1,578 | 1,730 | 9.63 | 899 | 713 | -20.69 | 3,870 | 3,929 | 1.52 |
| ලෙබනන් | 1,797 | 1,726 | -3.95 | 293 | 195 | -33.45 | 1,132 | 1,081 | -4.51 | 3,222 | 3,002 | -6.83 |
| සයිප්‍රස් | 2,188 | 1,389 | -36.52 | 478 | 399 | -16.53 | 250 | 207 | -17.20 | 2,916 | 1,995 | -31.58 |
| මැලේසියාව | 476 | 454 | -4.62 | 92 | 24 | -73.91 | 2,072 | 1,930 | -6.85 | 2,640 | 2,408 | -8.79 |
| මාලදිවයින | 275 | 328 | 19.27 | 1,000 | 1,013 | 1.30 | 779 | 770 | -1.16 | 2,054 | 2,111 | 2.78 |
| ද.කොරියාව | 818 | 953 | 16.50 | 1,360 | 1,495 | 9.93 | 96 | 50 | -47.92 | 2,274 | 2,498 | 9.85 |
| ඊශ්‍රාලය | 759 | 681 | -10.28 | 727 | 845 | 16.23 | 354 | 263 | -25.71 | 1,840 | 1,789 | -2.77 |
| වෙනත් රටවල් | 3,036 | 3,672 | 20.95 | 686 | 629 | -8.31 | 457 | 552 | 20.79 | 4,179 | 4,853 | 16.13 |
| එකතුව | 160,302 | 139,271 | -13.12 | 17,501 | 16,834 | -3.81 | 65,127 | 56,057 | -13.93 | 242,930 | 212,162 | -12.67 |

2017 වර්ෂය තුළ සවුදි අරාබිය, කටාර්, එක්සත් අරාබි එමීර් රජ්‍යය, කුවේටය, දකුණු කොරියාව, ඕමාන්, මාලදිවයින, ජෝර්දානය, බහරේන් සහ මැලේසියාව ප්‍රධාන වශයෙන් ශ්‍රමිකයින් ඉල්ලුම් කරන ලද රටවල් වූ අතර එය සමස්ථ රැකියා සඳහා විගමනයින් 93.56% කි.

## රැකියා මට්ටම අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම් 1998 - 2017

| Year | වෘත්තිමය | | මධ්‍ය රැකියා | | ලිපිකරු හා සමාන්තර | | පුහුණු | | අර්ධ පුහුණු | | නුපුහුණු | | ගෘහ සේවිකා | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | No. | % | No. | % | No. | % | No. | % | No. | % | No. | % | No. | % | |
| 1998 | 695 | 0.43 | 2,823 | 1.77 | 4,896 | 3.06 | 31,749 | 19.87 | - | - | 34,304 | 21.46 | 85,349 | 53.4 | **159,816** |
| 1999 | 1,253 | 0.7 | 3,161 | 1.76 | 6,210 | 3.46 | 37,277 | 20.74 | - | - | 43,771 | 24.35 | 88,063 | 49 | **179,735** |
| 2000 | 935 | 0.51 | 3,781 | 2.08 | 5,825 | 3.2 | 36,475 | 20.02 | - | - | 35,759 | 19.63 | 99,413 | 54.57 | **182,188** |
| 2001 | 1,218 | 0.66 | 3,776 | 2.05 | 6,015 | 3.27 | 36,763 | 19.98 | - | - | 33,385 | 18.14 | 102,850 | 55.89 | **184,007** |
| 2002 | 1,481 | 0.73 | 4,555 | 2.24 | 7,239 | 3.55 | 45,478 | 22.32 | - | - | 36,485 | 17.9 | 108,535 | 53.26 | **203,773** |
| 2003 | 1,541 | 0.73 | 7,507 | 3.58 | 6,779 | 3.23 | 47,744 | 22.75 | - | - | 44,264 | 21.09 | 102,011 | 48.61 | **209,846** |
| 2004 | 1,827 | 0.85 | 6,561 | 3.06 | 6,679 | 3.11 | 45,926 | 21.39 | - | - | 43,204 | 20.12 | 110,512 | 51.47 | **214,709** |
| 2005 | 1,421 | 0.61 | 8,042 | 3.48 | 7,742 | 3.35 | 46,688 | 20.19 | - | - | 41,904 | 18.12 | 125,493 | 54.26 | **231,290** |
| 2006 | 1,713 | 0.85 | 6,638 | 3.29 | 7,911 | 3.92 | 45,063 | 22.31 | - | - | 40,912 | 20.26 | 99,711 | 49.37 | **201,948** |
| 2007 | 1,653 | 0.76 | 3,962 | 1.81 | 4,551 | 2.08 | 50,263 | 23.01 | 3,499 | 1.6 | 52,176 | 23.88 | 102,355 | 46.85 | **218,459** |
| 2008 | 2,835 | 1.13 | 8,667 | 3.46 | 6,791 | 2.71 | 59,718 | 23.84 | 5,326 | 2.13 | 59,239 | 23.65 | 107,923 | 43.08 | **250,499** |
| 2009 | 2,832 | 1.15 | 6,388 | 2.58 | 6,719 | 2.72 | 61,321 | 24.81 | 6,015 | 2.43 | 50,173 | 20.3 | 113,678 | 46 | **247,126** |
| 2010 | 3,057 | 1.14 | 6,884 | 2.57 | 7,923 | 2.96 | 71,537 | 26.74 | 4,932 | 1.84 | 60,422 | 22.59 | 112,752 | 42.15 | **267,507** |
| 2011 | 3,844 | 1.46 | 6,134 | 2.33 | 9,906 | 3.77 | 67,726 | 25.76 | 4,180 | 1.59 | 63,680 | 24.22 | 107,491 | 40.88 | **262,961** |
| 2012 | 4,448 | 1.57 | 9,280 | 3.29 | 16,184 | 5.73 | 67,150 | 23.77 | 3,467 | 1.23 | 62,907 | 22.27 | 119,011 | 42.14 | **282,447** |
| 2013 | 5,151 | 1.76 | 16,510 | 5.63 | 26,561 | 9.06 | 73,707 | 25.14 | 3,412 | 1.16 | 70,977 | 24.21 | 96,900 | 33.05 | **293,218** |
| 2014 | 5,372 | 1.79 | 20,778 | 6.91 | 29,267 | 9.73 | 73,162 | 24.33 | 3,977 | 1.32 | 79,519 | 26.44 | 88,628 | 29.47 | **300,703** |
| 2015 | 6,251 | 2.37 | 6,951 | 2.64 | 12,501 | 4.75 | 81,682 | 31.01 | 4,847 | 1.84 | 77,985 | 29.60 | 73,226 | 27.80 | **263,443** |
| 2016 | 6,574 | 2.71 | 8,235 | 3.39 | 10,864 | 4.47 | 76,559 | 31.51 | 3,930 | 1.62 | 71,641 | 29.49 | 65,127 | 26.81 | **242,930** |
| 2017 | 6,371 | 3.00 | 7,124 | 3.36 | 9,265 | 4.37 | 68,993 | 32.52 | 3.295 | 1.55 | 61,057 | 28.78 | 56,057 | 26.42 | **212,162** |

(මූලාශ්‍රයඃතො.තාක්ෂණ අංශය ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්යාංශය)

2013 වසරේ සිට විදේශ රැකියා සඳහා පිටත්වීම් සම්බන්ධව රජයේ නව ප්‍රතිපත්ති හදුන්වා දීම හේතුවෙන් ගෘහ සේවිකා විගමනය පහත වැටී ඇති අතර වෘත්තීමය රැකියා සදහා විගමනය වීම ඉහළ ගොස් ඇත.

## විදේශ රැකියා සඳහා පිටත්වීම්

| වර්ෂය | 2016 | 2017 |
|---|---|---|
| පිරිමි | 160,302 | 139,271 |
| කාන්තා (ගෘහ සේවිකා නොවන) | 17,501 | 16,834 |
| ගෘහ සේවිකා | 65,127 | 56,057 |
| එකතුව ( මුළු කාන්තා) | 82,628 | 72,891 |
| මුළු පිටත්වීම් | 242,930 | 212,162 |

(මූලාශ්‍රයඃතො.තාක්ෂණ අංශය ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්යාංශය)

2017.01.01 සිට 2017.12.31 කාල පරිච්ඡේදය සළකා බැලීමේදී 212,162 ක් වූ මුළු පිටත්වීම් සංඛ්‍යාවෙන් පිරිමි ශ්‍රමිකයින්ගේ සහභාගීත්වය 139,271 (65.64%) ක් වන අතර, කාන්තා ශ්‍රමිකයින්ගේ සහභාගීත්වය 72,891 (34.36%) ක් විය. මෙම කාලය තුළ මුළු පිටවීම් සංඛ්‍යාවෙන් 56,057 ක් ගෘහසේවිකා / ගෘහ පාලිකා සහායක සම්බන්ධ රැකියා බව තවදුරටත් දැක්විය හැක.ඒ අනුව, 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ මුළු පිටත්වීම් ප්‍රමාණය 12.67% කින් අඩුවී ඇත. (උදා - 2016 242,930 ක් සහ 2017 212,162 ක්).

## ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම් 2016 සහ 2017




2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ රැකියා සඳහා විගමනය වූ පිරිමි 13.12% කින් පහළ ගොස් ඇති අතර කාන්තා ශ්‍රමිකයන්ගේ විගමනය 11.78% ක පහත වැටීමක්ද පෙන්නුම් කරයි.



## ජාතික ආර්ථිකයට විගමනික ශ්‍රමිකයන්ගේ දායකත්වය

### විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මූලාශ්‍රයන් 2016 සහ 2017

| වර්ගය | 2016<br>ඩී.ජ.ඩො.මි. | 2017<br>ඩී.ජ.ඩො.මි. | වර්ධනය |
|---|---|---|---|
| ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ | 7,242 | 7,164 | -1.08 |
| සංචාරක කර්මාන්තය | 3,508 | 3,631 | 3.21 |

(මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව)

ශ්‍රී ලාංකීය ආර්ථිකයේ ඉහළම විදේශීය ආදායම් ප්‍රභවය ලෙස, විදේශ රැකියා සලකුණු වී ඇත. 1976 සිට විධිමත් මාර්ග වලින් විදේශගත වීම් ආරම්භ වන විට ශ්‍රමික ප්‍රේෂණ ප්‍රමාණයත් වැඩි වූ අතර ඒ සමගම විදේශ රැකියා අවස්ථා ලබා දීමෙන් එය තරුණ, තරුණියන්ගේ විරැකියා ගැටළුවටද සහනයක් විය.

### ශ්‍රමික ප්‍රේෂණ 2013 -2017

| වර්ෂය | ප්‍රේෂණ | |
|---|---|---|
| | රු. මිලියන | ඩී.ජ.ඩො. මිලියන |
| 2013 | 827,689 | 6,407 |
| 2014 | 916,344 | 7,018 |
| 2015 | 948,957 | 6,980 |
| 2016 | 1,054,500 | 7242 |
| 2017 | 1,092,000 | 7164 |

(මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව)

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2018.02.02 දින නිකුත් කරන ලද මධ්‍ය වාර්තාවට අනුව 2017 වර්ෂය තුල ශ්‍රමික ප්‍රේෂණ ඇ.ඩො.මි. 7,164 (රු.මි. 1,092,000) සහ 2016 වර්ෂය තුළ ශ්‍රමික ප්‍රේෂණ ඇ.ඩො.මි. 7,242 (රු.මි. 1,054,500)ක් වේ. ඒ අනුව 2017 වර්ෂයේ ශ්‍රමික ප්‍රේෂණ ප්‍රමාණය, 2016 වර්ෂය සමග සැසඳීමේදී 1.08% න් පහළ ගොස් ඇත.

# විදේශ රැකියා අමාත්‍යංශය

## 1. දල විශ්ලේෂණය

විගමනික ශ්‍රමිකයන් ජාතික ආර්ථිකයට දක්වන සුවිශේෂී දායකත්වය අවබෝධ කරගනිමින් 2007 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට විදේශ රැකියා ක්ෂේත්‍රය වෙනුවෙන් වෙනම අමාත්‍යංශයක් පිහිටුවන ලදී. 2010 වර්ෂයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමග මෙම අමාත්‍යංශය ඒකාබද්ධ කළද මාස කිහිපයකට පසු විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය ලෙස යළි ස්ථාපනය කරනු ලැබිණි.

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යංශය, 2015 වසරේ විදේශ රැකියා අමාත්‍යංශය, ලෙස නම් කරන ලදී. 2018 වසරේදි විදේශ රැකියා අමාත්‍යාංශය විදුලි සංදේශ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සමග ඒකාබද්ධ කල අතර ගරු හරින් ප්‍රනාන්දු මහතා (පා.ම.) අමාත්‍යවරයා ලෙස පත් වු අතර ගරු මනුෂ නානායක්කාර (පා.ම.) මහතා නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස පත් කෙරිණි. වසන්ත දේශප්‍රිය මහතා අමාත්‍යාංශයේ ලේකම් ලෙස කටයුතු කරයි.

විදේශ රැකියා අමාත්‍යාංශය, යටතේ පවතින ආයතන ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය නම්කල හැකිය.

විදේශ රැකියා සඳහා විගමනය, ආර්ථිකයට හා සමාජයට දිගින් දිගටම වැදගත් වීම සැලකිල්ලට ගනිමින් අමාත්‍යාංශය ශ්‍රම විගමනයට අදාළ සිය දිගුකාලීන දැක්ම, අරමුණු හා කැපවීම ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රමුඛ අවධානය ලබා දී තිබේ

## 2. දැක්ම / මෙහෙවර සහ සේවය සදහා වු කැපවීම

දැක්ම



විගමනික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ සුබසාධනය සහතික කිරීම සිදු කරන අතරම වාසිදායක විදේශ රැකියා අවස්ථා නිර්මාණය කිරීමෙහිලා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ ආයතනය බවට පත් කිරීම.

මෙහෙවර



සමස්ත ශ්‍රම විගමන අංශයම ඉල්ලුම මගින් මෙහෙයවෙන ක්‍රියාවලියක් බවට පරිවර්තනය කිරීම හා ජාතික ආර්ථිකය කෙරෙහි ශ්‍රම විගමන අංශයෙහි දායකත්වයෙහි වැදගත්කම අවබෝධ කරගනිමින්, ජාත්‍යන්තර වෙළඳපොල අභියෝග වලට මුහුණ දීම පිණිස අවශ්‍ය ප්‍රවර්ධනාත්මක හා සුබසාධක ක්‍රියාකාරකම් මෙන්ම ව්‍යුහමය වෙනස්කම්ද හදුන්වාදිම මගින් අතිශයින් තරගකාරි ආයතනයක් බවට පත් කිරීම.

## අමාත්‍යාංශයේ සේවා කැපවීම

- විදේශ රැකියා විෂයට සහ ඒ යටතේ පවතින ආයතනයන්හි (ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය) විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- සංක්‍රමණික සේවා නියුක්තිකයන්ගේ වෘත්තීමය ගැටලුවලට පිළියම් ලබාදීම සහ සුබසාධනය ඉහළ නැංවීම.
- විදේශගත ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා නව නීති හඳුන්වාදීම
- රැකියා නියෝජිතායතන නියාමනය සහ අධීක්ෂණය කිරීම
- අමාත්‍යංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු
- අමාත්‍යංශය යටතේ ඇති ආයතනයන් අධීක්ෂණය කිරීම

## 3. අභ්‍යන්තර පරිපාලනය

**පාලන අංශය -** අමාත්‍යාංශයේ ප්‍රධානතම පරිපාලන කටයුතු සම්බන්ධීකරණ අංශය වන්නේ පාලන අංශය වේ. පෞද්ගලික ලිපිගොනු, ප්‍රවාහනය,වැටුප් වර්ධක,බඳවාගැනිම්,පුරප්පාඩු පිරවීම්, අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙළ කිරීම,පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු ලබා දිම,පාර්ලිමේන්තු කාරක සභා සම්බන්ධ කටයුතු,විදේශ නිවාඩු, උපයෝගිතා බිල්පත් ගෙවිම,ගොඩනැගිලි කුලී,පුහුණු කිරීම්,දුත මණ්ඩල තනතුරු සඳහා පත් කිරීම්,ස්ථාන මාරු,සේවා කාලය දීර්ඝ කිරීම්,සේවය අවසන් කිරීම්,මහජන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වැනි ආයතනවල පරිපාලන කටයුතු සිදු කිරීම සම්බන්ධව වගකීම දරයි.

**ගිණුම් අංශය -** වාර්ෂික අයවැය,වාර්ෂික විසර්ජන ගිණුම, අමාත්‍යාංශයේ අත්තිකාරම් 'බී' ගිණුම පිළියෙළ කිරීම, වැටුප් ගෙවීම්,වෙනත් ගෙවීම්, ප්‍රසම්පාදන,ප්‍රතිපාදන යැවීම්,ගබඩා කළමණාකරණය පිළිබඳ වගකීම දරයි.

**සංවර්ධන අංශය -** සංවර්ධන ක්‍රියාකාරී සැළසුම්, ප්‍රගති සමාලෝචන රැස්වීම්, වාර්ෂික කාර්ය සාධන වාර්තා, ප්‍රගති වාර්තා, සම්බන්ධ කටයුතු සිදු කිරීම, ජාතික උපදේශන කමිටු, වැඩසටහන් උපදේශන කමිටු සහ අනෙකුත් කමිටු, සංවර්ධන විෂයට අදාළ කැබිනට් පත්‍රිකා අවබෝධතා සහ වෙනත් ගිවිසුම් වලට අදාළ කටයුතු, අබුඩාබි සංවාදය, කොළඹ ක්‍රියාදාමය, විගමනය හා සංවර්ධන පිළිබඳ ගෝලීය සංසදය ආදී කලාපීය සහයෝගිතා සහ සංවාද සම්බන්ධ කටයුතු, සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,සහ පසුවිපරම් කිරීම සහ ක්ෂෙත්‍රයට අදාළ පනත් සහ ප්‍රතිපත්ති සැකසීම සම්බන්ධ කාර්යයන්හි වගකීම දරයි.

**ප්‍රාදේශීය පරිපාලන අංශය -** මෙම අමාත්‍යංශය මගින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර සිටින සංවර්ධන නිලධාරීන් හා සම්බන්ධ පුහුණු කිරීම්,ස්ථාන මාරු,වැටුප් වර්ධක,සේවය ස්ථිර කිරීම්,විනය ක්‍රියාමාර්ග සහ උසස්වීම්වැනි පරිපාලන කටයුතු, පවුල් පසුබිම් වාර්තා හා සම්බන්ධ කටයුතු, සංවර්ධන නිලධාරීන් පිළිබඳ දත්ත සමුදායක් පවත්වා ගැනිම හා යාවත් කාලීන කිරීම, විගමනික ශ්‍රමිකයන් පිළිබඳ සංඛ්‍යාලේඛන සහ විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීම සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සම්බන්ධ වගකීම දරයි.

**අභ්‍යන්තර විගණන අංශය -** විගණන කළමනාකරණ කමිටු රැස්වීම් (කාර්තුමය වශයෙන්) පැවැත්වීම, වාර්ෂික විගණන සැළසුම් සැකසීම, අභ්‍යන්තර විගණන පරීක්ෂණ හා විශේෂ පරීක්ෂණයන් පිළිබඳ වාර්තා සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම හා ඉදිරිපත් කිරීම, විගනක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම් සහ විගනක විමසුම් සඳහා පිළිතුරු සැකසීම සම්බන්ධ වගකීම දරයි.

(ඇමුණුම 01 - අමාත්‍යාංශයේ සංවිධාන සැලැස්ම)

## 4. මානව සම්පත් කළමණාකරනය

### i. අපගේ මානව සම්පත




(ඇමුණුම 2 2017.12.31 දිනට අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ සංයුතිය )

### ii. පුහුණුව සහ සංවර්ධනය

අමාත්‍යංශය නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය ඉලක්ක කර දේශීය හා විදේශිය පුහුණු වැඩසටහන් ගණනාවකට ඔවුන්ව යොමුකර ඇත.

ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගෙන් ඵලදායී සේවාවක් ලබා ගැනිම උදෙසා ඔවුන්ව පුහුණු කිරීම සහ අඛණ්ඩ අධීක්ෂණයට ලක් කිරීම සිදු කරනු ලබයි.අලුතින් බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්ද, මෙම අමාත්‍යංශය මගින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින සංවර්ධන නිලධාරීන්ට ඔවුන්ගේ ධාරිතා වර්ධනය කර ගැනීමට සහ විගමනික ශ්‍රමිකයන්ගේ සුබ සාධනය වැඩි දියුණු කිරීම සඳහා ද එම නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. සහභාගිවන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

**සංවර්ධන නිලධාරීන් සඳහා වු පුහුණු වැඩසටහන්**

| වැඩසටහන් | කාලසීමාව | සහභාගි වු නිලධාරීන් ගණන | වැඩසටහන් ප්‍රමාණය |
|---|---|---|---|
| අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වු වැටසටහන් | දින 03 | 326 | 10 |
| ආනෙකුත් ප්‍රතිපාදන යටතේ වැඩසටහන් (ස්විස් සංවර්ධන සහයෝගිතා ප්‍රතිපාදන) | දින 07 | 369 | 10 |

ප්‍රාදේශීය පරිපාලන අංශය - විදේශ රැකියා අමාත්‍යාංශය

**පුහුණු / සංචාර**

| වැඩසටහන් / කාලසීමාව | සහභාගි වු ගණන | වැඩසටහන් ප්‍රමාණය | වියදම |
|---|---|---|---|
| දේශීය | | | |
| 1. මසකට අඩු | 46 | 18 | 399,000.00 |
| 2. මසකට වැඩි අවුරුද්දට අඩු | 27 | 05 | 412,500.00 |
| 3. අවුරුද්දට වැඩි | 09 | 09 | 485,500.00 |
| 4. බැහැරගත පුහුණු පාඨමාලා (OBT) | 01 | 45 | 587,658.88 |
| විදේශීය | | | |
| නිල විදේශ සංචාර | 10 | 09 | 1,515,466.00 |
| 1. මසකට අඩු | 06 | 06 | 3,631,537.78 |

විගමනික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම සඳහා වු ප්‍රධාන උපාය මාර්ග

## 5. විගමනික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම සඳහා වු ප්‍රධාන උපාය මාර්ග

### 1. දේශිය සන්දර්භය තුළ විගමනික ශ්‍රමිකයින් සවිබල ගැන්වීම

විගමනික ශ්‍රමිකයින්ගේ පවුල් වල සමාජිකයින් ආරක්ෂා කිරීම අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යයක් වන අතර විගමනිකයින්ගේ ආරක්ෂාව මෙන්ම ඔවුන් විදෙස්ගතව සිටින කාලසිමාවේදි පවුලේ සමාජිකයින්ගේ ආරක්ෂාව උදෙසා අමාත්‍යාංශය මගින් විවිධ වැඩසටහන් දියත්කර ඇත.

#### පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම

2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නිකුත් කරන ලද පවුල් පස්බිම් වාර්තා සංඛ්‍යාව 30,464 කි. ප්‍රතිශතයක් ලෙස ගත් කල එය ඉල්ලුම් කරන ලද වර්තා සංඛ්‍යාවෙන් 93% කි. නිර්දේශ නොකරන ලද පවුල් පසුබිම් වාර්තා සංඛ්‍යාව 2250ක් වන අතර එය ඉල්ලුම් කළ මුලු සංඛ්‍යාවෙන් 7% කි. වැඩිම පවුල් පසුබිම් වාර්තා සංඛ්‍යාවක් නිර්දේශ කර ඇත්තේ බස්නාහිර පළාතෙනි.

**පවුල් පසුබිම් වාර්ථා - 2017**



## ශ්‍රමික සුරැකුම

ශ්‍රමික සුරැකුම වැඩසටහන විගමනික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා සුබසාධනය ඉලක්ක කරගනිමින් 2016 වසරේදී ආරම්භ කරන ලදි. මේ යටතේ විගමනික ශ්‍රමික ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම අරමුණු කරගෙන 05 වසර, අ.පො.ස (සා/පෙළ) සහ අ.පොස (උ/පෙළ) සමත් විගමනික ශ්‍රමික පවුල් වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම, විගමනික ශ්‍රමික පවුල් වල ආබාධිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා ණය සහ නිවාස ණය ලබාදීම, වෘත්තීය පුහුණු වැඩසටහන් සහ වෛද්‍ය සායන පැවැත්වීම ආදීය සිදු කරයි.

ශ්‍රමික සුරැකුම වැඩසටහන යටතේ 2017 වර්ෂයේදී ලියාපදිංචි වූ විගමනික ශ්‍රමික සංඛ්‍යාව 34,408 කි. ඉන් බහුතරය වන 27,547ක් කාන්තා විගමනිකයන් වන අතර, 6861 ක් පිරිමි විගමනිකයන් වේ. 2017 වසරේ ශ්‍රමික සුරැකුම ලියාපදිංචිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩි විගමනික ප්‍රජාවක් ලියාපදිංචි කරගෙන ඇති අතර එය 4066 ක් වශයෙන් දත්ත වාර්තා කර ඇත. කොළඹ (3973), අම්පාර(2360), හා අනුරාධපුර (2186) ක් ලෙස පිළිවෙළින් දෙවනුවට වැඩි ලියාපදිංචියක් පෙන්වා ඇති අතර, අවම ලෙස මොණරාගල දිස්ත්‍රික්කය වාර්තා වන අතර එහි විගමනික ශ්‍රමිකයින් 355ක් ලියා පදිංචි කර ඇත.

**ශ්‍රමික සුරැකුම යටතේ 2017 වසරේදී ලියාපදිංචිය
(දිස්ත්‍රික්ක අනුව)**




## පවුල් සංවර්ධන සැලසුම් සහ රැකවරණ සැළසුම්

මෙම අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්ගේ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ විගමනික ශ්‍රමික පවුල්වල ජීවන තත්ත්වය නගාසිටුවීමට සහ දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම අරමුණු කරගනිමින් පවුල් සංවර්ධන සැළසුම් හඳුනාගනු ලබන පවුල් වෙනුවෙන් සකස් කෙරේ.

විගමනික ශ්‍රමික පවුල් වල හා විශේෂයෙන් සමාජීය අවදානමකට ලක්ව සිටින දරුවන්ගේ අවශ්‍යතාවයන් ඉහත සදහන් කර ඇති සංවර්ධන නිලධාරින් විසින් හදුනාගනු ලබයි. මෙමඟින් ශ්‍රමිකයා විදෙස්ගතව සේවය කරන කාලසීමාවේදී ඔවුනගේ දරුවන්ගේ සමාජීය අවදානම අවම කිරීම මුලික කර කටයුතු කරනු ලැබේ. ශ්‍රමික සුරැකුම යටතේ 2017 වර්ෂයේ දී සකස් කරන ලද පවුල් සංවර්ධන සැලසුම් සංඛ්‍යාව 5221 කි.

**පවුල් සංවර්ධන සැලසුම් - 2017**




**ප්‍රජාව දැනුවත් කිරීමේ අධ්‍යාපන වැඩසටහන**

පවුල් සංවර්ධන සැලසුම් සහ රැකවරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමට අමතරව විදේශ රැකියා අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරීන් විසින් විගමනික ශ්‍රමිකයන්ගේ භෞතික සහ අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.ශ්‍රමික පවුල්වලින් මතුවන ගැටළු අනුව මෙම වැඩසටහන් සංවර්ධන නිලධාරීන් විසින්ම හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අතුරින් කිහිපයක් පහත දැක්වේ,

1 ස්වයං රැකියා කුසලතා සංවර්ධන වැඩසටහන්,
2 මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්,
3 ළමා ආරක්ෂාව සම්බන්ධව සහ අධ්‍යාපන අවශ්‍යතා පාදක කරගත් වැඩසටහන්,
4 වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්
5 ගෘහස්ථ ඵලදායිතා වැඩසටහන්
6 ජංගම සේවාවන්
7 විගමනික පවුල් කණ්ඩායම් වශයෙන් දැනුවත් කිරීම.

දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩි වශයෙන් දකුණු සහ නැගෙනහිර පළාත් වල පවත්වා ඇති අතර බහුතර විගමනික ප්‍රජාවක් ලියාපදිංචි පළාත් වීම ඒ සඳහා බලපා තිබේ. ඒ අනුව දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 7068ක් මේ වන විට පවත්වා ඇත.



## විගමනික සේවකයන් සඳහා යෝජිත විශ්‍රාම වැටුප් ක්‍රමය

විගමණික ශ්‍රමිකයින් සඳහා වන යෝජිත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා 2016.09.28 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර ඒ සඳහා 2016.11.01 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි.

මෙම විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ප්‍රතිපාදන අන්තර්ගත කරමින් පනතක් හඳුන්වා දීම සිදුවන අතර අදාළ පනත් කෙටුම්පත පිළියෙල කොට නෛතික කරුණු අවසාන ලෙස සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත.

## ii. ජාත්‍යාන්තර සහයෝගිතාව තුළින් විගමනික ශ්‍රමිකයින් සවිබල ගැන්වීම

**අවබෝධතා ගිවිසුම් එකඟතා**

මිනිස් බල ක්ෂේත්‍රය, මානව ධාරිතා සංවර්ධනය, ජාත්‍යාන්තර සමාජ ආරක්ෂණ වැඩසටහන, පුහුණු වැඩසටහන්, නීති කටයුතු හා සුහඳ සබඳතා වැනි විවිධාකාර අරමුණු ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විවිධ රටවල් සමඟ ගිවිසුම් ගණනාවකට එළඹී ඇත. අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එකඟතා / අවබෝධතා ගිවිසුම් 20ක් ක්‍රියාත්මක කරමින් සිටී.මෙම වර්ෂය තුළ එළඹෙන ලද අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 06කි.

**අත්සන් කරන ලද නව ගිවිසුම් / අවබෝධතා ගිවිසුම්**

- **ජපානය -** ශ්‍රීලංකා තාක්ෂණික සීමාවාසිකයන් සඳහා ජපානයේ තාක්ෂණික සීමාවාසික පුහුණු වැඩසටහන පිළිබඳ සහයෝගිතා ගිවිසුම

- **ජර්මනිය -** ෆෙඩරල් ජර්මානු ජනරජයේ වයෝවෘද්ධිකයන් සඳහා  සාත්තු සේවක/සේවිකාවන් ලෙස පිරිස් පුහුණු කිරීමට අදාළ සාධාරණ බඳවා ගැනීම් සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති පිළිබඳ අභිමතය පෙරදැරි කරගත් ඒකාබද්ධ ප්‍රකාශනය.

- **ජපානය** සමඟ අත්සන් කරන ලද තාක්ෂණික ගිවිසුම්

  - තාක්ෂණික සීමාවාසිකයන් බඳවාගැනීම සම්බන්ධ තාක්ෂණික ගිවිසුම
  - තාක්ෂණික සීමාවාසික පුහුණු වැඩසටහන් වලට සහභාගීවන තාක්ෂණික සීමාවාසිකයින්ගේ සීමාවාසික පුහුණුව අවසන් කිරීමට ප්‍රථම ගිවිසුම අවසන් කිරීම සම්බන්ධව දරණ ලද වියදම් පිළිබඳ තාක්ෂණික ගිවිසුම
  - ජපානයේ සීමාවාසික තාක්ෂණික පුහුණු වැඩසටහන් යටතේ සිටින ශ්‍රී ලාංකීය තාක්ෂණික සීමාවාසිකයන්ගේ ජීවන තත්ත්වය පිළිබඳ තාක්ෂණික ගිවිසුම
  - ජපානයේ සීමාවාසික තාක්ෂණික පුහුණු වැඩසටහන් යටතේ සිටින ශ්‍රී ලාංකීක තාක්ෂණික සීමාවාසිකයන්ගේ ඉදිරියට උත්පාදනය විය හැකි වියදම් පිළිබඳ තාක්ෂණික ගිවිසුම.



**ඒකාබද්ධ කමිටු රැස්වීම්**

1. කටාර් රාජ්‍ය සමග අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම අනුව පිහිටුවා ඇති ඒකාබද්ධ කමිටුවේ 02 වන රැස්වීම 2017 මැයි 03වන දින කොළඹදී පැවැත්විය.

2. සවුදි අරාබි රාජ්‍ය සමග අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම අනුව පිහිටුවා ඇති ඒකාබද්ධ කමිටුවේ 02 වන රැස්වීම 2017 ජනවාරි 09 සහ 10 දෙදින රියාද් වලදී පැවැත්විය.

3. ඕමානය සමග වු ඒකාබද්ධ තාක්ෂණික කණ්ඩායමේ 2වන රැස්වීම 2017 නොවැම්බර් 6 සහ 7 දින ඕමානයේදී පැවැතිවිය.

## iii . ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීම

විදේශ රැකියා සඳහා පුද්ගලයින් බඳවා ගැනිම විධිමත් කිරීම අරමුණු කර ගනිමින් 21/1985 වු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත.

විදේශ රැකියා සඳහා පුද්ගලයින් යොමු කිරීමේ ක්‍රියාවලියේදී අතරමැදියන් කිහිපදෙනෙක් ඒ සඳහා දායකත්වය ලබාදේ. බඳවා ගැනිමේ ක්‍රියාවලිය තුළ මෙම අතර මැදියන් අත්‍යවශ්‍ය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

එම නිසා මෙහිදී අතරමැදියන් නියාමනය කිරීම සහ විගමනික ශ්‍රමිකයින්ගේ රැකවරණය සහ ආරක්ෂාව මෙන්ම කර්මාන්තයේ නියාමනය තවදුරටත් ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

## 6. 2017 වසරේ කලාපීය සංවාද හා ජාත්‍යන්තර සංසද සඳහා සහභාගි වීම

### i. කොළඹ ක්‍රියාදාමය

2017 වසර තුළදී ශ්‍රී ලංකාව පහත දැක්වෙන ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් සඳහා පුද්ගලිකව සහ බිලූ ජීන්ස් තාක්ෂණය ඔස්සේ සහභාගි විය.

තේමාත්මක ක්ෂේත්‍ර ක්‍රියාකාරී කණ්ඩායම්

| | |
|---|---|
| කුසලතා සහ සුදුසුකම් හඳුනාගැනීම | 03 |
| ආචාර ධර්මීය බඳවාගැනීම ප්‍රවර්ධනය | 04 |
| පූර්ව පිටත්වීම් පුහුණුකිරීම සහ සවිබල ගැන්වීම | 03 |
| ප්‍රේෂණ | 03 |
| ශ්‍රම වෙළඳපොළ විශ්ලේෂණය | 02 |

### ii. අබුඩාබි සංවාදය

- අබුඩාබි සංවාදයෙහි සිව්වන  අමාත්‍ය සමුළුව සහ පස්වන ජ්‍යෙෂ්ඨ නිලධාරි රැස්වීම 2017 ජනවාරි මස 23 සහ 24 යන දිනයන්හිදී කොළඹ පවත්වන ලදී.මෙහිදී අබු ඩාබි සංවාදයෙහි සභාපතීත්වය වසර දෙකක කාල සීමාවක් සඳහා කුවේට් රාජ්‍යය විසින් ශ්‍රී ලංකාව වෙත භාරදීම සිදු විය.

- දින දෙකක විශේෂ වැඩමුළුවක් 2017 ජුලි මාසයෙහිදී ඩුබායි නුවරදී පවත්වන ලදී.

  මෙම වැඩමුළුවෙහිදී මූලික අරමුණු වුයේ පහත වැඩසටහන් සඳහා සාමාජික රටවලට සමීප සම්බන්ධතාවක් පවත්වා ගැනීම සඳහා පහසුකම් සැපයීමයි.

  - ශ්‍රමික බඳවා ගැනීම් සඳහාවු විකල්ප  ක්‍රම වේදයන්
  - කුසලතා සහතික කිරීම සහ අන්‍යෝන්‍ය පිළිගැනීම
  - සවිස්තරාත්මක තොරතුරු සහ සමෝදාන වැඩසටහන
  - ශ්‍රම සංචලනය පාලනය කිරීම සඳහා වු තාක්ෂණය

- සුරක්ෂිත, ක්‍රමවත්, විධිමත් විගමනය සදහා වු සම්මුතිය තුලින් රාජ්‍යයන් අතර සිදුවන ක්‍රියාවලිය පිළිබඳ අබුඩාබි සංවාදය  තුලින් දක්වන දායකත්වය සම්බන්ධ වාර්තාවක් 2017 දෙසැම්බර් 4 සහ 6 දින වලදි මෙක්සිකෝ වලදි පැවැත්වු  සුරක්ෂිත, ක්‍රමවත්, විධිමත් විගමනය සදහා ගෝලිය සම්මුතිය  වෙත එහි අවසාන ප්‍රගති රැස්වීමට ඉදිරිපත් කර ඇත.



### iii. විගමනය සහ සංවර්ධන පිළිබඳ ගෝලීය සංසදය

විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසද සමුළු රැස්වීම 2017 ජුනි 28 -30 දක්වා බර්ලින්හිදී පැවැත්වුණි.

මෙවර විගමණය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසද සමුලු රැස්වීම පවත්වනු ලැබුයේ **"විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සමාජ ගිවිසුමක් කරා"** යන තේමාව ඔස්සේය. එය අනු තේමා තුනක් වටා ව්‍යුහගත කොට තිබූ අතර එක් එක් අනු තේමාව වටමේස සැසි දෙකකින් සමන්විත විය. කුඩා කණ්ඩායම් සහභාගි වූ කෙටි සැසි හතරකින් සහ රජයන්, අන්තර්ජාතික සංවිධාන, සිවිල් සමාජ, පුද්ගලික අංශය ආදිය සමග බහු පාර්ශවකාර වේදිකාවක්වූ පොදු අවකාශයකින් සමන්විත වූ සංසද සමුලු ව්‍යාපාරික යාන්ත්‍රණ රැස්වීම යටතේ පූර්ණ සැසි වාරයක් පවත්වනු ලැබීය. මෝල්ඩෝවාව සහ එක්සත් රාජධානිය සමග ශ්‍රී ලංකාව "ජාතික උපායමාර්ග හරහා විගමණ ප්‍රතිපත්ති සංවර්ධනය; දේශීය ප්‍රතිපත්තිවල සඑලතාව ඉහළ නැංවීම" පිළිබඳ අනු තේමාව යටතේ "ප්‍රතිපත්ති අරමුණු සඳහා මෙවලම් සහ ආරක්ෂණ" පිළිබඳව පැවැති වට මේස 1.1 හි සම සභාපතිත්වය දරන ලදී.

### iv. සුරක්ෂිත ක්‍රමවත් විධිමත් විගමනය සඳහා ගෝලිය ගිවිසුම

ජාතික උපදේශනයට පෙර සංවේදීකරණ රැස්වීම් දෙකක් රාජ්‍ය පාර්ශවකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමග 2017 අගෝස්තු 8 දින පවත්වන ලදී.

එහිදී පළවූ අදහස් මේ දක්වා ජාතික උපදේශනය සඳහා පදනමක් ලෙස ක්‍රියාකළ අතර එය මානව හිමිකම් මෙහෙයුම් කාරකයන්, පාලනය, සංවර්ධනය සහ ඩයස්පෝරාව, නීති විරෝධී ප්‍රවාහණය සහ පුද්ගල ජාවාරම, අවිධිමත් විගමණය සහ ශ්‍රම සංචලතාව යන උත්තේජක කණ්ඩායම් හයට පාර්ශවකරුවන්ගේ අදහස් ඉදිරිපත් කිරීමේ අරමුණ ඇතිව 2017 අගෝස්තු 25 වැනි දින පවත්වන ලදී.

අවසන් වාර්තාව සම සභාපතිවරුන් වෙත ඉදිරිපත් කරන ලදී.

### v. විගමන පාලන දර්ශකය

විගමණ පාලන දර්ශකය යනු වඩා යහපත් විගමන පාලනයක් කරා රටවල ප්‍රගතිය මැණීම පිණිස වූ රාමුවකි. එක් එක් රටට නිශ්චිතවූ විගමන පාලන ව්‍යුහයන් ඇගයීම සඳහා ඒකාබද්ධ රාමුවක් සැපයීමට සහ විගමනය ආශ්‍රිත තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම දැනුම්දීම සඳහා විභව මූලාශ්‍රයක් ලෙස ක්‍රියා කිරීම එය අරමුණු කොට ඇත. විගමන පාලන දර්ශකයේ ප්‍රතිඵල වනු ඇත්තේ තම විගමන ප්‍රතිපත්තිවල විස්තීරණත්වය පරීක්ෂා කිරීමේදී සහ අඩුපාඩු හඳුනා ගැනීමේදී රජයන්ට සහායවීම සඳහා වූ මෙවලමක් වන අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා විගමනය සඳහා අන්තර්ජාතික සංවිධානය, විගමණය සඳහා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනය විසින් බලය පැවරූ අතර සැලසුම් කරනු ලැබූයේ ද ඉකොනොමිස්ට් සඟරාවේ ආර්ථික බුද්ධි ඒකකයයි. විගමන පාලන දර්ශකයේ දෙවන අදියරේදී රටවල් සඳහා පැතිකඩ සකස් කිරීම පිණිස තෝරාගත් රටවල් 15 අතුරින් එකක් ශ්‍රී ලංකාව විය.

ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමන දර්ශකය සකස්කිරීම ආරම්භවූයේ දී ඉකොනොමිස්ට් බුද්ධි ඒකකය විසින් පවත්වනු ලබන තොරතුරු එක්රැස් කිරීමේ සමීක්ෂණයකින් වන අතර එහි අරමුණ වනුයේ;

1. ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලවීම සහ විගමණිකයන්ගේ අයිතිවාසිකම් සපුරාලීම,
2. සාක්ෂි සහ "රජයේ සමස්තයම" ප්‍රවේශය භාවිතා කරමින් ප්‍රතිපත්ති සම්පාදනය,
3. විගමනය සහ ඒ ආශ්‍රිත ගැටලු ආමන්ත්‍රණය සඳහා පාර්ශවකරුවන් සමග කටයුතු කිරීම,
4. විගමනිකයන්ගේ සහ සමාජයේ සමාජ ආර්ථික යහපැවැත්ම ප්‍රගමනය,
5. අර්බුදවල සංචලන මානයන් සඑලව ආමන්ත්‍රණය කිරීම,
6. සුරක්ෂිත, ක්‍රමවත් සහ අභිමානවත් ආකාරයකින් විගමනය සිදුවන බව සහතික කිරීම,

යන ආදර්ශ හය මත පදනම්ව රට තුළට හා රටින් පිටතට සිදුවන විගමනය පිළිබඳ විගමන පාලන ව්‍යුහයන් අන්තර්ගත කිරීමයි.

## vi. සංවර්ධනය හා සහයෝගිතාව පිළිබඳව වු ස්විස් නියෝජිත ආයතනය

සංවර්ධනය හා සහයෝගිතාව පිළිබඳව වු ස්විස් නියෝජිත ආයතනය යනු ස්විස්ටර්ලන්ත රජයේ ද්විපාර්ශවික ප්‍රතිපාදන ආයතනයකි. සංවර්ධනය වෙමින් පවත්නා රටවල දිළිදුකම තුරන් කිරීම ඉලක්ක කර ගනිමින් රජයේ හා සිවිල් සමාජයේ සංවර්ධන කටයුතු සඳහා සහයෝගය ලබාදෙමින් මෙම සංවර්ධන සහයෝගිතා ආයතනය ක්‍රියාත්මක වේ. මෙම නියෝජිත ආයතනයේ පහත සදහන් තේමාන්තික අංශයන් අරමුණු කරනු ලැබේ. සෞඛ්‍ය, අධ්‍යාපනය, ජලය, කෘෂිකර්මය/ ග්‍රාමීය සංවර්ධනය, පරිසරය, රැකියා සහ ආර්ථිකය, නිතිය ක්‍රියාත්මක කිරීම, ප්‍රජාතන්ත්‍ර අර්බුද වලක්වා ගැනිම හා ඉවත්කිරීම, විගමනය, ආර්ථික සමෝධානය, පාලනය හා ලිංග භේදයයි. ස්විස් සංවර්ධන සහයෝගිතාව ශ්‍රී ලංකාව තුල යහපත් රැකියා කොන්දේසි ප්‍රවර්ධනය කිරීම සඳහා සංවර්ධනය හා විගමනය පිළිබඳව ගෝලීය වැඩසටහන් පහත අදියරයන් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

අදියර i ජාතික ශ්‍රමික සංක්‍රමණ ප්‍රතිපත්තිය යොදා ගැනිම මගින් විගමනිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයිතින් ආරක්ෂා කිරීම.

අදියර ii රැකියා සඳහා විගමනය විම තුලින් පැන නගින සමාජීය හා ආර්ථික පිරිවැය අවම කිරීම හා විදේශ රැකියා මගින් තිරසර ප්‍රයෝජන සලසා ගැනිම.

අදියර iii විගමනික ශ්‍රමිකයින්ගෙ ආරක්ෂාව, සංවර්ධනය සඳහා විගමනයේ දායකත්වය ඉහල නැංවිම සහ ආරක්ෂාකාරි හා විධිමත් විගමනය සඳහා දායකත්වය ලබා දිම. ජාතික ශ්‍රමික සංක්‍රමන ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාවට නැංවිම තහවුරු කිරීම. (ශ්‍රී ලංකාව වර්තමානයේ මෙම අදියරේ පවති)

මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් වැඩසටහන් 2017 වසරේදි ක්‍රියාත්මක කරන ලදි.

| ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|
| රජයේ සේවකයින්, සිවිල් සමාජ සංවිධාන හා අනෙකුත් පාර්ශව කරුවන් හට ආරක්ෂාකාරි විගමනය පිලිබදව වැඩසටහන් පැවැත්විම. (sensitization programmes )<br><br>රජයේ සේවකයින්, සිවිල් සමාජ සංවිධාන හා අනෙකුත් පාර්ශව කරුවන් හට වෙනත් අංශයන් පිලිබදව වැඩසටහන් පැවැත්විම. (ව්‍යාපෘති හදුන්වාදිමේ රැස්විම්, ආරක්ෂාකාරි විගමන ක්‍රියාකාරකම්, ව්‍යවසායකත්ව පුහුණුව, වෘතිය පුහුණුව, පවුල් අයවැය වැඩසටහන්, නීති උපදේශන වැඩසටහන්)<br><br>ජාතික මට්ටමේ දැණුම කලමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විම. | 407<br><br><br><br>122<br><br><br><br><br>147 |
| (PAC) දත්ත ගබඩා පද්ධතියක් පිහිටුවිම<br>ජාතික මට්ටමේ උපදේශන කමිටුව | කලින් අදියර 3හි හවුල් කරුවන් මත පරික්ෂා කරන ලදි.<br>සමාජිකයින් 18ක් සදහා පවත්වන ලදි |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල තෝරා ගත් පුද්ගලයින් හට නිතිමය රාමුව පිළිබඳ පුහුණුවක් ලබාදිම. | 24 දෙනෙකු සඳහා ලබා දෙන ලදි. |

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**දැක්ම**

එතෙර වෙළඳපොළ සඳහා නිපුණතාවයෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම

**මෙහෙවර**

දේශීය ආර්ථිකයට දායක වෙමින් හා සියලුම පාර්ශවකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවයන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානාත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරීම

### අරමුණු

විදේශ සේවා නියුක්ති කාර්යාංශය 1985 අංක 21 දරණ විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ පිහිටුවා ඇත.කම්කරු විගමනික සෑම පියවරක්ම ජාතික විගමනික කම්කරු ප්‍රතිපත්තිය මගින් මාර්ගෝපදේශනය සපයයි

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ප්‍රධාන අරමුණු පහත සඳහන් පරිදි සාරාංශ ගත කර දැක්විය හැකිය.

- ශ්‍රී ලාංකිකයන් සඳහා එතෙර රැකියා අවස්ථා නංවාලීම හා සංවර්ධනය කිරීම.
- බලපත්‍රලාභී නියෝජිත ආයතනවල කටයුතු නියාමනය කිරීම හා ඒවාට පහසුකම් සැපයීම.
- විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත ආරක්ෂාව හා සුභසාධනය සැලසීම.

## ප්‍රධාන විෂයපථය හා කාර්යයන්

- ශ්‍රී ලාංකිකයන් එතෙර රැකියාවලට බඳවා ගැනීම පිණිස විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම
- දේශීය නියෝජිත ආයතන වෙත විදේශ රටවලින් ලැබෙන රැකියා ඇණවුම් සඳහා අනුමැතිය ලබා දීම්
- පුද්ගලයන් බඳවා ගැනීම වෙනුවෙන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යය මගින් සිදු කෙරෙන ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රචාරක දැන්වීම්වලට අනුමැතිය ලබා දීම
- ශ්‍රී ලංකාවෙන් නික්ම යාමට පෙර විගමනික ශ්‍රමිකයන් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම
- දේශීය නියෝජිත ආයතන, විදේශීය රැකියා නියෝජිත ආයතන හා ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු අංශය යන පාර්ශ්වයන්ගේ සහයෝගය ඇතිව, විගමනික ශ්‍රමිකයන්ගේ ආරවුල් විසඳීමට ක්‍රියාකිරීම හා එතෙරදී අවශ්‍ය සුභසාධන කටයුතු සැලසීම
- විගමනික ශ්‍රමිකයන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ආරක්ෂාව හා සුභසාධනය සැලසීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලාංකිකයන් සඳහා එතෙර රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම
- විවිධ වැඩසටහන් මාර්ගයෙන් එතෙර රැකියා සඳහා යාමට අපේක්ෂා කරන ශ්‍රමිකයින්ට සහාය වීම

## i. යහපාලනය හා කර්මාන්තය නියාමනය කිරීම

විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විගමනික ශ්‍රමිකයන්ට ආරක්ෂාව සලසමින් විදේශ රැකියා කර්මාන්තය නියාමනය කරන අතර එහි ප්‍රවර්ධනයද සිදු කරනු ලබයි

### විදේශ රැකියා නියෝජිත ආයතන ලියාපදිංචි කිරීම

| | | |
|---|---|---|
| 1 | නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව | 07 |
| 2 | අලුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව | 989 |
| 3 | ලියාපදිංචි කළ සහ ලියාපදිංචිය අලුත් කරන ලද විදේශීය රැකියා නියෝජිත ආයතන (සත්කාරක රටවල) සංඛ්‍යාව හා දත්ත සංචිතය යාවත්කාලින කිරීම | 1638 |

### විදේශ රැකියා ඇණවුම් සඳහා අනුමැතිය ලබා දීම හා විදේශ රැකියා සඳහා පිටත්වීම්

| | | 2017 |
|---|---|---|
| 1 | අනුමත කරන ලද රැකියා ඇණවුම් ප්‍රමාණය | 3132 |
| 2 | අනුමත කරන ලද ප්‍රචාරක දැන්වීම් ප්‍රමාණය | 1225 |
| 3 | ලැබූ විදේශ රැකියා ඇබෑර්තු ප්‍රමාණය | 501124 |
| 5 | අනුමැතිය ලබා දෙන ලද ශ්‍රමිකයින් සංඛ්‍යාව (බලපත්‍රලාභි රැකියා නියෝජිත ආයතන මගින් විගමනික ශ්‍රමිකයින් බඳවා ගැනිම) | 68564 |
| 6 | අනුමැතිය ලබා දෙන ලද ශ්‍රමිකයින් සංඛ්‍යාව (පුද්ගල / ස්වයං මාර්ග යෙන් විගමනික ශ්‍රමිකයින් බඳවා ගැනිම) | 143598 |

(මූලාශ්‍රය - පළමු අනුමත අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

### බලපත්‍රලාභී / බලපත්‍රලාභී නොවන නියෝජිත ආයතන වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම

| | | | 2017 |
|---|---|---|---|
| 1 | බලපත්‍රලාභි ඒජන්සි වලට එරෙහිව මහජනතාවගෙන් ලැබුනු පැමිණිලි වලට එරෙහිව සිදු කරන ලද විමර්ෂණ | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 1987 |
| | | විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව | 3763 |
| 3 | නිති විරෝධ වැටලිම් සම්බන්ධව සිදුකරන ලද වැටලිම් සංඛ්‍යාව | | 210 |
| 3 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වලංගු බලපත්‍රයක් නොමැතිව විදේශ රැකියා ක්ෂත්‍රයේ නියැලි සිටි තැනැත්තන්ට විරුද්ධව පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන | | 905 |
| 4 | 2009 අංක 56 හා 1994 අංක 04 දරණ පනත්වලින් සංශෝධිත 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ සිදුකර ඇති අපරාධ සඳහා බලපත්‍රලාභී / බලපත්‍රලාභී නොවන තැනැත්තන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම් | | 616 |
| 5 | විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එරෙහිව පවරන ලද නඩු | පැවරූ නඩු ප්‍රමාණය | 04 |
| | | උසාවියේ පෙනි සිටි වාර ගනන | 130 |
| 6 | අක්‍රමිකතා සිදු කර ඇති බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන තැනැත්තන්ට එරෙහිව කාර්යාංශය විසින් පැවරූ නඩුසඳහා පෙනී සිටීම් | පැවරූ නඩු ප්‍රමාණය | 239 |
| | | උසාවියේ පෙනි සිටි වාර ගණන | 3637 |

(මූලාශ්‍රය - නීති අංශය / විමර්ශන අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)




### නීති වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

| | | | 2017 |
|---|---|---|---|
| 1 | වෙනත් ආයතන මගින් පවත්වනු ලබන නීති වැඩමුළු සඳහා සහභාගී වීම් | | 05 |
| 2 | මිනිස් ජාවාරම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම්(මිනිස් වෙළෙඳාමට එරෙහි කාර්යංශ ඒකකය) | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 08 |
| | | සහභාගී වූ දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් සංඛ්‍යාව | 05 |
| 3 | මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ ඒකකය වෙත ලද පැමිණිලි | හඳුනාගත් පැමිණිලිසංඛ්‍යාව | 46 |

(මූලාශ්‍රය - නීති අංශය / මිනිස් වෙළඳාමට එරෙහි කාර්යංශ ඒකකය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

## 2. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් 2017 වසර තුළදී විමර්ශණ නිලධාරීන් 6ක්, (ද්විතිය පදනම මත), පරිවර්තකයිනන් 03, නිති නිලධාරීන් 1 (කෝනත්රාත් පදනම මත), නේවාසිකාගාර පාලකයින් 03ක්, පර්යේෂණ නිලධාරීන් 01ක් හා කළමනාකාර සහකාර 36ක් ලෙස නව පත්වීම් 50 ලබා දී ඇත.

### කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධන වැඩසටහන්

| වැඩමුළු/ පාඨමාලා ගාස්තු | පුද්ගලයින් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.මි) |
|---|---|---|
| වැඩමුළු | 245 | 2.14 |
| පාඨමාලා | 18 | 3.12 |
| එකතුව | 263 | 5.26 |

(මූලාශ්‍රය - පරිපාලන අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

## 3. විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආරක්ෂා කිරීම සහ සවිබල ගැන්වීම.

### 3.1 සුභසාධක ක්‍රියාකාරකම්

සම්පූර්ණ විගමනික ක්‍රියාවලියේ තුන් ආකාරයේදීම විගමනික සේවකයින් හා ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව හා බලසම්පන්න කිරීමෙහි ක්‍රියාදාමය විදේශ සේවා නියුක්ති කාර්යාංශය හඳුනාගෙන තිබේ. පිටත්වීමට පෙර (තීරණ ගැනීමේ සිට පිටත්වීම සඳහා පුහුණුව) පිටත්වන අවස්ථාව (සේවකයින් රැකියා නියුක්තියේදී ඔවුන්ගේ පවුල් වීසඳහා සූදානම් කිරීම) සහ නැවත පැමිණී හා සමාජගත කිරීම(ඇගයීම,පිළිගැනීම සැලකිල්ලට භාජනය කරමින් සමාජගත කිරීම)විදේශ සේවා නියුක්ති කාර්යාංශය එහි පරමාර්ථ ලඟාකර ගැනීමට නිශ්චිත මිණුම් ක්‍රියාත්මක කිරීම හා වැඩසටහන් හඳුන්වා දී තිබේ.

#### රක්ෂණ ප්‍රතිලාභ

විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම

| රක්ෂණ වාරික සංඛ්‍යාව | ගෙවූ මුදල (රු` මි) |
|---|---|
| 211,098 | 138.28 |

විගමනික සේවක රක්ෂණය යටතේ ප්‍රතිලාභ ගෙවීම (වෛද්‍ය වියදම්, මරණ වන්දි ඉල්ලීම් හා නැවත ශ්‍රී ලංකාවට පිටත්කර හැරීමේ වියදම් පියවීම ඇතුලත්ව)

| රක්ෂණ වන්දි ප්‍රමාණය | ගෙවූ මුදල (රු මි) |
|---|---|
| 2,166 | 174,31 |

(මූලාශ්‍රය - සුබසාදන අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)




#### අඩු පොලී යටතේ ණය ලබා දීම

විගමණික ශ්‍රමිකයන් හට අඩු පොලී යටතේ නිවස ණය ලබාදී ඇත

| | |
|---|---|
| අඩු පොලී ණය ලබාදුන් සංඛ්‍යාව | 201 |
| ගෙවූ ණය පොලිය | 0.34 |

## විගමණික ශ්‍රමිකයින්ගේ දු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම

| විස්තරය | ප්‍රතිලාභ ලද දරුවන් සංඛ්‍යාව | වියදම (රු මී) |
|---|---|---|
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් | 985 | 14.775 (15,000×985) |
| සමාන්‍ය පෙළ සමත් දරුවන් ප්‍රමාණය | 1850 | 37 (20,000×1850) |
| උසස් අධ්‍යාපනය සඳහා යොමු වී ඇති දරුවන් | 413 | 12.39 (30000×413) |
| එකතුව | 3248 | 64.165 |

(මූලාශ්‍රය - සුබසාදන අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)





## ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් සඳහා සුභසාධන වැඩසටහන්

ශ්‍රී ලංකාව විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ආරක්ෂාව හා අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය හා බැඳී ඇත. මෙම සම්මුතියට අනුව විගමනික සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල් වල අයගේ සුබසාධනය හා ආරක්ෂාව වෙනුවෙන් ප්‍රතිපත්ති කිහිපයක් කිහිපයක් සකස් කර ඒවා ඉටු කිරීමට අවශ්‍ය වැඩසටහන් කිහිපයක් හදුන්වා දී ඇත. ඒ යටතේ පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබාගත් සෑම විගමනික ශ්‍රමිකයකු සඳහාම නොමිලේ ජීවිත රක්ෂණ ආවරණයක් ලබාදිම
- ජාතික විභාග සහා ඉලක්ක සපිරූ විගමනික සේවකයින්ගේ දු දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම
- රාජ්‍ය බැංකු හරහා පෙර විගමනික ණය ලබා දීම
- දිවයින පුරා පිහිටි විදේශ සේවා නියුක්ති කාර්යාංශ පුහුණු මධ්‍යස්ථාන වලදි ගෘහස්ථ සේවයේ රැකියා සඳහා පිටත්වන කාන්තාවන්ට හා ගෘහස්ථ නොවන සේවයේ කාන්තා හා පිරිමි අය සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම
- විදේශගත වී අතරමං වු හා කරදරයට පත්වූ අයට නැවත පැමිණීමට ගුවන් ටිකට් පත්‍ර ලබාදිම
- විදේශ රටවල පවත්වාගෙන යන සහන නිවාස වල පිළිසරණක් නොමැති වූ විගමනික කාන්තාවන්ට සහන සලසනු ලැබේ. නිවෙස්වලින් පලාගොස් රැකවරණය පතන කාන්තාවන් හට මෙම මධ්‍යස්ථාන වලදී ඉඳුම් හිටුම්, වෛද්‍ය පහසුකම්, ආහාර ප්‍රවාහන පහසුකම් සැපයීම.
- ශ්‍රී ලාංකික සේවකයින්ගේ යහපත සොයාබැලීම සඳහා විගමනික සේවකයින් ලබාගන්නා සෑම රටකම පිහිටුවා ඇති දූත මණ්ඩල සඳහා සුබසාධන නිළධාරීන් පත්කිරීම.
- ගුවන්තොටුපොල ආසන්නයේ පිහිටුවා ඇති සහන පියස සුබසාධක මධ්‍යස්ථානය මගින් නොයෙක් අසනීප තත්ත්වයන්ට හා කරදරයට පත්ව නැවත පැමිණෙන සේවකයන් සඳහා සහන සැළසීම.

## සුබ සාධක සේවා සැපයීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පැමිනෙන විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුලේ සමාජිකයින් සඳහා අවශ්‍යතාවය මත සුභසාධක සේවා සපයනු ලැබේ (ආහාර හා බස් ගාස්තු)

| විස්තරය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | වියදම රු මි |
|---|---|---|
| වියදම රු මි | 4,368 | 0.336 |
| ආහාර සැපයීම | 4,368 | 0.336 |
| බස් ගාස්තු ගෙවීම | 26 | 0.044 |

(Source: P.A. Action Plan 2017 - SLBFE)

## විගමනික ශ්‍රමිකයින් නැවත ගෙන්වා ගැනීම

| | නැවත ගෙන්වා ගත් පුද්ගලයින් සංඛ්‍යාව | වියදම රු මි |
|---|---|---|
| ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් මුහුණ පාන විවිධ දුෂ්කරතාවයන් හේතුවෙන් සේවක සුභසාධක අරමුදල භාවිතා කර එම සේවකයින් මෙරටට ගෙන්වා ගැනීම් | 38 | 1.41 |
| රක්ෂණ වැඩසටහන යටතේ ගෙන්වා ගැනීම | 29 | 0.78 |

(මූලාශ්‍රය - පළමු අනුමැතිය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

**නැවත ගෙන්වාගැනීම - 2017**




## සේවක සුභසාධක අරමුදල යටතේ සහන සැලසීම

විගමනික ශ්‍රමිකයින්ගේ රක්ෂණය මගින් ආවරණය නොවන හෝ රක්ෂාවරණය කල් ඉකුත් වූ පුද්ගලයින් වෙත සේවක සුභසාධක අරමුදල මගින් විශේෂ සහන සැලසීම යටතේ පුද්ගලයින් 113ක් සඳහා (රු මි) 22.9 2017 වසරේදී ගෙවා ඇත.

| ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැයවූ මුදල (රු මි) |
|---|---|
| 113 | 22.9 |

(මූලාශ්‍රය - සුබසාදන අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)



Awarding compensation under Workers Welfare Fund

## විගමනික ශ්‍රමිකයින් සඳහා වෛද්‍ය පහසුකම් සැලසීම

| විස්තරය | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | ගෙවූ මුදල |
|---|---|---|
| වෛද්‍ය පහසුකම් සැලසීම | 1,120 | 0.85 |

## විගමනික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් සඳහා පාසැල් උපකරන ලබා දීම

| | |
|---|---|
| ප්‍රතිලාභ ලැබූ දරුවන් සංඛ්‍යාව | 56 |
| වැයවූ මුදල (රු මි) | 0.268 |



## ළමා ආරක්ෂණ වැඩසටහන්

| | |
|---|---|
| ප්‍රතිලාභ ලැබූ දරුවන් සංඛ්‍යාව | 3 |
| වැයවූ මුදල (රු මි) | 0.035 |

## ආබාධිත විගමණික ශ්‍රමිකයින් සඳහා නිවාස තනා දීම

| | |
|---|---|
| ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | 02 |
| වැයවූ මුදල (රු මි) | 0.312 |

## විගමනික ශ්‍රමිකයින් සඳහා සහන පියස මගින් සහාය ලබා දීම

- විදේශයන් හි සිට නැවත ශ්‍රී ලංකාවට පැමිණ කටුනායක සහන පියස හා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණෙන විගමනික ශ්‍රමිකයින් 4471ක් සඳහා සුභසාධන සහාය ලබාදීම. (බස් ගාස්තු. වෛද්‍ය ප්‍රතිකාර, ප්‍රවාහන පහසුකම්, ආහාරපාන , නාවතැන් පහසුකම් ආදිය) ඒ සඳහා ගෙවූ මුදල රු මි 13.09කි.

| | |
|---|---|
| ප්‍රමාණය | 4471 |
| වැයවූ මුදල (රු මි) | 13.09 |

## ගමනාන්ත රටවලදී ශ්‍රමිකයින් මුහුණදුන් ගැටළු නිරාකරණය කිරීම

මරණ සිද්ධීන්

| විස්තරය | ඒකක ප්‍රමාණය | වැයවූ මුදල (රු මි) |
|---|---|---|
| වාර්තා වූ මරණ | 291 | - |
| සේවක සුභසාධක අරමුදල යටතේ ශරීර කොටස් මෙරටට ගෙන්වා ගැනිම | 30 | 8.51 |
| මරණාධාර වියදම් ගෙවීම | 256 | 7.68 |

(මූලාශ්‍රය - පළමු අනුමැතිය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

සේවක සුභසාධක අරමුදලේ කමිටු රැස්වීම්

සේවක සුභසාධක අරමුදලේ කමිටු රැස්වීම් 10 ක් 2017 වසර තුළදී රු මි 0.44 වියදම් කර පවත්වන ලදි.

## විදේශිය දුත මණ්ඩල වෙත පත්කිරීම්

| විස්තරය | පත්කිරීම්/ සේවා දීර්ඝ කිරීම් |
|---|---|
| නව පත්වීම් | 26 |
| කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරිම | 46 |

(මූලාශ්‍රය - පළමු අනුමැතිය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

## දූත මණ්ඩල යැවීම් සහ දූත මණ්ඩල භාරගැනීම්

| විස්තරය | දූත මණ්ඩල සංඛ්‍යාව | වැයවූ මුදල රු මි |
|---|---|---|
| දූත මණ්ඩල යැවීම් | 43 | 13.24 |
| දූත මණ්ඩල බාර ගැනීම් | 14 | 2.93 |

(මූලාශ්‍රය - පළමු අනුමැතිය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

## විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් නියාමනය කිරීමේ ක්‍රම වේදය

විදේශිය තනාපති කාර්යාල මගින් ශ්‍රි ලාංකික ශ්‍රමිකයින් 10,191 දෙනෙකු ලියාපදිංචි කර ඇත.

## ගුවන් ටිකට් පත ලබා දීම

විදෙස්ගත වන ශ්‍රමිකයින් හට සහනදායි ගාස්තුවක් යටතේ ගුවන් ටිකට්පත් ලබා ගැනිම සඳහා සහාය වීම් සිදු කරයි. ඒ යටතේ 2017 වසරේදී 3817 දෙනෙකු වෙත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලය විසින් ගුවන් ටිකට්පත් ලබා දිමට සහය දී ඇත.

# 3.2 විගමනික ශ්‍රමිකයන්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

## රැකියා අපේක්ෂකයින් සඳහා “ජාතික වෘත්තීය සුදුසුකම් III (NVQ III) මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

2012 සැප්තැම්බර් මස තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම (ටී වී ඊ සි) සමග අත්සන් කරන ලද ගිවිසුම පරිදි කාර්යාංශය මගින් පවත්වා ගෙන යනු ලබන ගෘහ පාලිකා පුහුණු වැඩසටහන“ජාතික වෘත්තීය සුදුසුකම් ෂෂෂ”මට්ටමදක්වා ඉහළ නංවනු ලැබීය.එය ජාත්‍යන්තරව පිළිගත් මට්ටමකි.

මෙම පුහුණු වැඩසටහන් මගින් ගෘහ පාලිකා සහකාර ලෙස මැදපෙරදිග රටවල්, සිංගප්පූරුව, හොංකොං හා සයිප්‍රස් ආදී රටවල් සඳහා ගෘහස්ථ සේවය සඳහා පිටත්වන කාන්තාවන්හට මෙම “ජාතික වෘත්තීය සුදුසුකම් 3වන මට්ටමට සුදුසුකම් සපුරාලීමට අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ. මේ වන විට මෙම “ජාතික වෘත්තීය සුදුසුකම් එන් වී කිව්” සහතිකය ලබා ගැනීම සියලුම මැදපෙරදිග රටවල්, සිංගප්පුවරුව, සයිප්‍රස්, හොංකොං,මැලේසියාව සහ මාලදිවයින වැනි යුරෝපීය හා නැගෙනහිර ආසියාතික රටවල් සඳහා අනිවාර්ය කර ඇත.

## ගෘහ පාලිකා සහකාර වරියන් හට පුහුණු වැඩසටහන් - මැදපෙරදිග අංශය (NVQ 3 වන මට්ටම)

| වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| 138 | 2440 |

(මූලාශ්‍රය - දේශීය පුහුණු අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

## ගෘහ පාලිකා සහකාර වරියන් හට පුහුණු වැඩසටහන් - යුරෝපා හා නැගෙනහිර අසියානු අංශය (NVQ 3 වන මට්ටම)

| වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| 28 | 517 |

(මූලාශ්‍රය - දේශීය පුහුණු අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

## උපස්ථායක පුහුණුව - (NVQ 3වනමට්ටම)

| වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| 17 | 290 |

(මූලාශ්‍රය - දේශීය පුහුණු අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

## සාක්ෂරතා පුහුණුව

ගෘහස්ථ රැකියා සඳහා යාමට අපේක්ෂා කරන කාන්තා ශ්‍රමිකයන් සඳහා දින18ක සාක්ෂරතා පුහුණුව ලබා දීම (සිංහල හා දෙමළ භාෂා).

| වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| 11 | 143 |

(මූලාශ්‍රය - දේශීය පුහුණු අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

## ගෘහස්ථ නොවන ශ්‍රමිකයින් සඳහා පුහුණුව

ගෘහස්ථ නොවන රැකියා සඳහා යන ගැහැණු සහ පිරිමි ශ්‍රමිකයින් සඳහා දින 05ක පුහුණු වැඩසටහනක් පැවැත්වීම

| වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| 968 | 26456 |

(මූලාශ්‍රය - දේශීය නොවන පුහුණු අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

# මැද පෙරදිග නොවන රටවල රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයන් සඳහා පුහුණුව ලබාදීම

## පෙර පලපුරුද්ද සනාථ කිරීමේ පුහුණු වැඩසටහන

| වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| 130 | 1,388 |

(මූලාශ්‍රය - දේශීය පුහුණු අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

පෙර විගමනික පුහුණු වැඩසටහන - දකුණු කොරියාව

රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා අවස්ථා සඳහා පිටත්වීමට නියමිතව ගිවිසුම් අත්සන් කරන ලද රැකියා අපේක්ෂකයින් සඳහා පෙර විගමනික දැණුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

| වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| 63 | 2,441 |

(මූලාශ්‍රය - දේශීය නොවන පුහුණු අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)




පෙරවිගමනික පුහුණු වැඩසටහන - දකුණු කොරියාව

## 4. සංවර්ධන කාර්යභාරය සහ රැකියා සඳහා විගමනය සම්බන්ධ කිරීම

### 4.1. ශ්‍රී ලාංකිකයින් සඳහා වඩාත් වාසිදායක රැකියා අවස්ථා ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රවර්ධනය කිරීම

රැකියා බලපත්‍ර ක්‍රමය (ඊ පී එස් ) යටතේ ශ්‍රී ලාංකිකයින් දකුණු කොරියාවේ රැකියා සඳහා පිටත්වීම.

දකුණු කොරියවේ රැකියා අවස්ථා සඳහා පිටත්වීම්

| (EPS) යටතේ විගමනය වූ සංඛ්‍යාව | නැවත විදේශගත කිරීමේ වැඩසටහන යටතේ සංඛ්‍යාව | විශේෂ ඇපී යටතේ විගමනය වූ පුද්ගල සංඛ්‍යාව |
|---|---|---|
| 2,035 | 651 | 753 |

(මූලාශ්‍රය - බඳවා ගැනීමේ අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

රැකියා බැංකුව

විදේශ රැකියාවන් බලාපොරොත්තු වන අය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පවත්වාගෙන යනු ලබන අන්තර්ජාල ගත රැකියා බැංකුවෙහි ලියාපදිංචි වීමේ පහසුකම් සපයා ඇත. ඔවුන්ට ඔවුන් විසින්ම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය හරහා ලියාපදිංචි විය හැකි අතර ප්‍රධාන කාර්යාල සහ පළාත් කාර්යාල මගින් ද ලියාපදිංචි විය හැක. අයදුම්පත රැකියා බැංකුවට යොමු කිරීමෙන් පසු යොමු කල දින සිට උපරිම වසර 2 ක කාලයක් සඳහා එය වලංගු වේ.

මෙම වැඩසටහන මගින් සේවා යෝජකයින් හට/ රැකියා නියෝජිත ආයතනවලට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ රැකියා බැංකුව හරහා රැකියා අපේක්ෂකයින් සොයා ගැනීමට පහසුකම් සැලසේ.

| ලියාපදිංචි වූ සංඛ්‍යාව | රැකියා බැංකුවේ ලියාපදිංචි වි.රැකියා සඳහා පිටත්වීම් සංඛ්‍යාව |
|---|---|
| 13,034 | 1,011 |

(මූලාශ්‍රය - අලෙවිකරණ අංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා)

## 4.2. ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම

ශ්‍රී ලාංකික රැකියා අපේක්ෂකයින් සඳහා ලංකාවෙන් පිටත රැකියා අවස්ථා ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම.

### ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම - (දේශීය)

- විදේශ රැකියා පිළිබඳව වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුව ලබන පොදු ජනතාව/ ශිෂ්‍යයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත්වීම

| දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | ජංගම සේවා සංඛ්‍යාව |
|---|---|
| 164 | 12 |

(Source: P.A. Action Plan 2017 -SLBFE)

- විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය හා සංවර්ධනය පිලිබඳව වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත්වීම

### උපායමාර්ගික සම්බන්ධතා ගොඩනැගීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෘත්තීය පුහුණු ආයතන දේශීය රැකියා යෝජකයන් හා අනෙකුත් සියලුම පාර්ශව කරුවන් සමග උපායමාර්ගික සම්බන්ධතා ගොඩනැගීම තුළින් රැකියා විරහිත තරුණ තරුණියන්හට විදේශ රැකියා අවස්ථා ලබා දීමට මැදිහත් වී සිටියි.

## 5. සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම

### ISO 9001:2008 තත්ත්ව කළමනාකරණ වැඩ සටහන ක්‍රියාවට නැංවීම

ඉහල ගුණාත්මක සේවාවක් තුලින් සිය ගනුදෙනු කරුවන් තෘප්තිමත කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය 2012.11.06 දින ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබා ගන්නා ලදි. ඒ හා සමගාමීව ප්‍රධාන කාර්යාලය තුල ගුණාත්මක කළමනාකර ක්‍රමවේදය ස්ථාපිත කරන ලදි. එතැන් සිට ISO සහතිකය සියළුම ශාඛා කාර්යාල වල හා පුහුණු මධ්‍යස්ථන සඳහා ලබා ගන්නා ලදි. වර්තමානය වන විට ISO 9001. 2015 තත්ව සහතිකය ලබා ගැනිම සඳහා කටයුතු කරමින් සිටි.

### විදේශ රැකියා ඇණවුම් /ඇබෑර්තු සහ වෙළඳ දැන්වීම් කාර්යාංශ වෙබ් අඩවියේ පල කිරීම.

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ලැබූ විදේශීය රැකියා ඇණවුම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වෙබ් අඩවියේ පල කිරීමට පහසුකම් සලසා ඇත. ඊට අමතරව බලපත්‍රලාභීන් වෙත සලසන සේවාවක් පුළුල් කරනු වස් ඔවුන්ගේ ඇබෑර්තු පිළිබඳ වෙළඳ දැන්වීම් කාර්යාංශ වෙබ් අඩවියේ පළ කිරීමටද පහසුකම් සලසා ඇත.

### පැමිණිලි විසඳීමේ යාන්ත්‍රණය විමධ්‍යගත කිරීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එහි උපායමාර්ගික දිශානතිය වර්තමාන සේවා අවශ්‍යතාවයන්ට සහ දිවයින පුරා පුළුල් කරන ලද සේවාවන්ට ගැලපෙන පරිදි වෙනස් කර ඇත. කම්කරු ගැටළු විමධ්‍යගත විසඳීම කිරීම යටතේ සියලුම පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාලවල මෙම ගැටළු විසඳීම සඳහා සමථ නිලධාරීන් පත් කර ඇත. අදාළ මධ්‍යස්ථානවලදීම පැමිණිලි පරීක්ෂණ සඳහා සහභාගී වියයුතු බවට සියලු බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන වෙත උපදෙස් ලබා දී ඇත.

| ලද පැමිණිලි සංඛ්‍යාව | | විසඳා ඇති පැමිණිලි සංඛ්‍යාව | |
|---|---|---|---|
| සමථ අංශය | FR I & FR II | සමථ අංශය | FR I & FR II |
| 4,596 | 1,767 | 5,947 | 2452 |

(Source: P.A. Action Plan 2017 - SLBFE)



විගමනික ප්‍රජාවගේ ගැටලු විසඳීමේ ජංගම සේවය - පොළොන්නරුව

## විගමනික සම්පත් මධ්‍යස්ථාන

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙහෙයුම් ධාරිතාව ඉහල නංවා විගමනික ශ්‍රමිකයින් හට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකාවේ සෑම පලාතක්ම ආවරණය වන පරදි විගමනික සම්පත් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. රත්නපුර හා හාලි ඇල සම්පත් මධ්‍යස්ථාන 2017 වසරේදි සම්පූර්ණ වු අතර කතරගම සංචාරක බංගලා වේ වැඩ 97% අවසන් කර ඇත.

විගමනික මධ්‍යස්ථානය රත්නපුර



විගමනික මධ්‍යස්ථානය හාලි ඇළ



### විශේෂ ජයග්‍රහණ

- ශ්‍රී ලංකා තාක්ෂණික සීමාවාසිකයින් බඳවා ගැනිම සඳහා විදේශ රැකියා අමාත්‍යාංශය සහ ජාත්‍යාන්තර මිනිස්බල සංවර්ධන ආයතනය (අයි එම් ජපාන) සමග අවබෝධතා ගිවිසුමකට එළඹිම. දැනට මේ යටතේ බඳවා ගැනිම් සිදුකරනු ලබයි.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ඊශ්‍රාලය අතර උපස්ථාන සේවකයින් බඳවා ගැනිම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ අතර එමගින් මේ වන විට 14 දෙනෙකු ඊශ්‍රාලය වෙත යවා ඇත.
- ශ්‍රී ලංකික ශ්‍රමිකයින් රැකියා සඳහා කොරියානු රටට යැවීමට 2017.11.29 දින ගිවිසුමක් අත්සන් කර ඇත.
- කොරියානු භාෂා ප්‍රවිණිතා විභාගය 2017 වසර සඳහා පැවැත්වු අතර අයදුම්පත්‍ර 22,888 නිකුත් කර ඇත.

# ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය

## 1. හැඳින්වීම

රජයට අයත් එකම විදේශ රැකියා ඒජන්සිය වන ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයීය පරිපාලිත ආයතනයක් වශයෙන් විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ 1996 වර්ෂයේ සිට ස්ථාපිතව ක්‍රියාත්මක ආයතනයකි. 2013 වසරේදී ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම අයි .එස්. ඕ. 9001:2008 තත්ව සහතිකයෙන් පිදුම් ලැබීය.

**දැක්ම**

විදේශ රැකියා වෙළඳපොළට පුහුණු ශ්‍රමිකයන් සපයන ප්‍රමුඛ පෙළේ සේවා දායකයකු වීම

**මෙහෙවර**

ඒජන්සියේ මූලික අරමුණු හා ක්‍රියාකාරකම්වලට අනුගත අදාළ අමාත්‍යාංශ යටතේ ඇති ආයතන සමග සබඳතාවය වර්ධනය කර ගනිමින් විදේශ රැකියා වෙළඳපොළ ගවේශනයෙන් රැකියා අවස්ථා හඳුනා ගැනීම, ශ්‍රී ලාංකීය තරුණ - තරුණියන් විදේශ රැකියා වෙළඳපොළට ගැලපෙන අයුරින් පුහුණු කිරීම සහ සුරක්ෂිත සේවා තත්ත්වයන් යටතේ රැකියාවට බඳවා ගැනීම

## අරමුණු

- විදේශ රැකියා ඒජන්සියට අයත් ව්‍යාපාරික කටයුතු 1985 අංක 21 දරණ විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ හෝ වෙනත් කිසියම් ව්‍යවස්ථාපිත නීතියක් හෝ නීති පසුබිමක් යටතේ කලින් කලට බලාත්මක වන නීති වලට අනුකූලව පවත්වාගෙන යාම.
- ශ්‍රී ලංකාව තුළ හෝ විදේශීය වශයෙන් වෘත්තීමය, පරිපාලනමය, තාක්ෂණික හා කාර්මික පුහුණු,අර්ධ පුහුණු හෝ නුපුහුණු ගෘහස්ථ සහ හෝටල් සේවකයින්, ගුරුවරුන්,සේවා සපයන්නන් සහ සියලුම වර්ගවලට අයත් සේවකයින් සඳහා රැකියා පිරිනැමීම හෝ සැපයීම.
- මිනිස් බලය සපයන වෙළඳ රක්ෂණ, වාණිජ හෝ කර්මාන්ත වල පුද්ගලයන් ආයතන හා සංවිධාන වල නියෝජිතයකු,බ්‍රෝකර් වරයෙකු, උපදේශකයකු, විශේෂ උපදේශකයකු ලෙස පුද්ගල, ආයතන සංවිධාන ලෙස මෙන්ම එවැනි සේවා සැපයීම සඳහා වන ආයතන සමග අවබෝධතා ගිවිසුම් වලට ඇතුළත් වීම
- රැකියා අවශ්‍යතාවයන් සංතෘප්තියට ලක් කිරීම සඳහා සේවක පිරිසගේ හැකියාවන් ඉහල නැංවීම සඳහා අවශ්‍ය හැඩගැන්වීම සහ පුහුණු කිරීම් කර්තව්‍යන් කළමණාකරණය කිරීම'

## 01. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ ප්‍රධාන අංශයන්

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් ප්‍රධාන අංශ 04 ක් මගින් සිදුවේ.

i. බඳවා ගැනිමේ අංශය
ii. මූල්‍ය අංශය
iii. පරිපාලන හා මානව සම්පත් අංශය
iv. තොරතුරු තාක්ෂණ අංශය

### i. බඳවා ගැනිමේ අංශය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ මුඛ්‍ය පරමාර්ථය ලඟා කරගැනීම සඳහා විදේශීය නියෝජිතයින් සමග වාසිදයක කොන්දේසි යටතේ විදේශ රැකියා අවස්ථා ලබාගැනීම සඳහා ගනුදෙනු කිරීම බඳවාගැනීමේ අංශයේ ප්‍රධාන කාර්යය වේ.

මෙම අංශයේ ප්‍රධාන ක්‍රියාදාමයන් වන්නේ ,රැකියා ඇනවුම් සොයා ගැනීම,රැකියා ඇනවුම් සඳහා මූලික අනුමැතිය ලබා ගැනීම,රැකියා ඇනවුම් වලට අදාළ ප්‍රචාරයන් සඳහා අනුමැතිය ලබා ගැනීම අදාළ ලේඛන සම්පූර්ණ කිරීම(රැකියා ඇණවුම්,බලය පැවැරීම් සහ ගිවිසුම්) , බඳවා ගැනිම් සම්බන්ධ සියලුම කොමිස් හා ගාස්තු විදේශ ඒජන්සි/ සමාගම්/සේවා යෝජකයින්ගෙන් නොපමාව එකතුකර ගැනිම, බඳවා ගැනිම් සම්බන්ධ තොරතුරු හා වාර්තා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත අවශ්‍ය අවස්ථාවලදි ලබා දිම, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල සමග විදේශ රැකියා ප්‍රවර්ධනය ආම්පන්න සැපයිම වේ.

### ii. ගිණුම් අංශය

යහපත් මූල්‍ය විනයක් පවත්වා ගනිමින් ලැබිම් හා ගෙවිම් පාලන සහ බැංකු ගත කිරීම ,චෙක්පත් නිකුත් කිරීම,අතිරික්ත මුදල් ආයොජනය කිරීම,පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුව ගිණුම් පවත්වාගෙන යාම,මාසික හා වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ,සියළුම බදු ක්‍රමවත්ව හා නියමිත දිනට ගෙවීම පිළිබඳ වගකීම දරයි.

### iii. පරිපාලන හා මානව සම්පත් අංශය

පරිපාලන හා මානව සම්පත් අංශය මගින් දෛනික ආයතන පරිපාලන කටයුතු, පුද්ගලික ලිපිගොනු පවත්වා ගෙන යාම, සුපරීක්ෂණය හා අධීක්ෂණය, සියලුම මිලදී ගැනීම් අනුමත මිලදී ගැනීමේ ක්‍රියාපටිපාටියට අනුකූලව සිදු කිරීම, ආයතනය සතු රථවාහන සංචිතය කළමණාකරණය කිරීම, ආයතනයට අයත් සියලුම වත්කම් සුරක්ෂිත කිරීම සහ මානව සම්පත් කළමණාකරණය සහ අධීක්ෂණය පිළිබඳ වගකීම දරනු ලබයි.

### iv. තොරතුරු තාක්ෂණ අංශය

තොරතුරු තාක්ෂණ අංශය මගින් පරිගණක ජාල ගත කිරීම සහ පවත්වා ගෙන යාම, විද්‍යුත් තැපැල් සේවා හා අන්තර්ජාල සේ වා සැපයීම, ආයතන වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම,එහි දත්ත අවශ්‍ය තොරතුරු පද්ධති ස්ථාපනය කිරීම හා නඩත් තු කිරීම. රැකියා ඇයදුම් සම්පාදනය සහ රක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු පද්ධති ස්ථාපනය හා නඩත්තු කිරීම, පරිගණක සහ දෘඩාංග නඩත්තුව සියලු අංශ වෙත අවශ්‍ය තොරතුරු සහාය ලබාදීම පිළිබඳ කටයුතු කරයි.

# 03. ඉලක්ක සපුරා ගැනිම

## බඳවා ගැනිමේ අංශය

### රැකියා සඳහා පිටත්විමේ තෙරතුරු - 2017 වර්ෂය

| | සයිප්‍රස් | සිංගප්පූරුව | ඊශ්‍රායලය | මලයාසියාව | මාලදිවයින | ඕමානය | කුවේට් | ලෙබනන් | ඩුබායි | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගෘහස්ථ සේවක | 151 | 1 | | | | | | 2 | | 154 |
| බේකරිකරු | 5 | | | | | | | | | 5 |
| කම්කරු | 11 | | | | | | | | | 11 |
| වෑද්දුම්කරු | 2 | | | | | | | | | 2 |
| තාක්ෂණ ශිල්පි | 3 | | | | | | | | | 3 |
| ගෙවි | 3 | | | | | | | | | 3 |
| මස් කපන්නා | 3 | | | | | | | | | 3 |
| අත් උදව්කරු | | | | | | | | 1 | | 1 |
| ගෘහ සේවක | 6 | | | | | | | 2 | | 8 |
| රන්කරු | 2 | | | | | | | | | 2 |
| අරක්කැමි | 2 | | | | | | | | | 2 |
| පශු ඝාතක | 1 | | | | | | | | | 1 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 1 | | | | | | | | | 1 |
| පිරිසිදුකරන්නා | | | | | | | | 1 | | 1 |
| කෘෂි කාර්මික  සේවක | 31 | | 529 | | | | | | | 560 |
| වතු සේවක | | | | 37 | | | | | | 37 |
| බර වාහන රියදුරු | | | | | | | 2 | | | 2 |
| මෝටර් ඔතන්නා | | | | | 2 | | | | | 2 |
| ජුකි මැෂින් ක්‍රියාකරු | | | | | | 2 | | | | 2 |
| සහකාර ගණකාධිකාරි | | | | | 1 | | | | | 1 |
| වාහන විදුලි කාර්මික | | | | | 1 | | | | | 1 |
| යන්ත්‍ර සූත්‍ර ශිල්පියා | | | | | 1 | | | | | 1 |
| නිෂ්පාදන විධායක | | | | | | | | | 1 | 1 |
| සමාන්‍ය කම්කරු | | | | | | | | | 2 | 2 |
| එකතු | 221 | 1 | 529 | 37 | 5 | 2 | 2 | 6 | 3 | 806 |

පිටත්වීමේ තොරතුරු 2017 වර්ෂය

**රටවල් අනුව පිටත්වීම්**




**රැකියා කාණ්ඩය**






## ii. ගිණුම් අංශය

2006 හා 2007 වර්ෂ තුළදී කොරියානු රැකියා සඳහා විගමනය වුවන්ගෙන් ලබාගත් තැන්පතු වලින් රු 150,000ක් 2017 වසර තුළදී නැවත ගෙවන ලදි. රු මි 41.2 ක්ව තිබූ මුල් වගකීම මේ වන විට රු මි 16.4 දක්වා අඩුකර ගැනීමට හැකි වී ඇත. විදේශ රැකියා ඒජන්සිය වෙත ලැබී ඇති සියලුම තැන්පතු නැවත ඉල්ලීම් මේ වන විට පියවා ඇති අතර ඉදිරියේදී කරනු ලබන ඉල්ලීම් සඳහා පියවීම් අවස්ථානුකූලව ගෙවීමට කටයුතු කර ඇත.

විදේශ රැකියා ඒජන්සි මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ලබාගෙන තිබූ රු මි 20ක ණය මුදල සඳහා 2017 වසර තුළදී රු මි 3ක් පියවා ඇති අතර 2017.12.31 දින වන විට එම ණය ශේෂය රු මි 3ක් දක්වා අඩුවී ඇත.

### iii. පරිපාලන හා මානව සම්පත් කළමණාකරන අංශය




### iv. තොරතුරු තාක්ෂණ අංශය

විදේශ රැකියා අයදුම්පත්‍ර පරිගණකගත කිරීමේ සාරාංශය පහත පරිදි වේ.

| වර්ෂය | රැ අ සංඛ්‍යාව |
|---|---|
| 2014 | 857 |
| 2015 | 3274 |
| 2016 | 4388 |
| 2017 | 1383 |



### අයදුම්පත්‍ර පරිගණක ගත කිරීමේ මාසික ප්‍රගතිය

| මාසය | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නො | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අ ප | 96 | 81 | 158 | 73 | 129 | 87 | 111 | 250 | 140 | 114 | 78 | 66 |

### අයදුම් පත්‍ර පරිගණකගත කිරීම




**(ඇමුණුම 04)**

2017.12.31 දිනෙන් අවසන් අවසන් වර්ෂය සඳහා  අදායම් හා වියදම් සාරාංශය

| | 2017 ජන - දෙසැ විගණන නොකල වෙන් කිරීම් සමග | 2016 ජන - දෙසැ විගණනය කල |
|---|---|---|
| අදයම | 35,119,203.67 | 49,309,370.00 |
| අනෙකුත් මෙහෙයුම් අදයම | | |
| ඉතුරුම් පත පොලිය | 139,224.64 | 509,551.72 |
| ස්ථාවර තැන්පතු මත පොලිය | 10,136,605.43 | 6,842,798.61 |
| වි රු ඒජන්සි ලියාපදිංචි ගාස්තු | 1,092,189.14 | 787,026.07 |
| අපද ණය පොලි ආදයම | 87,123.21 | 48,163.13 |
| නේවාසික විදේශ මුදල් ගිණුමේ පොලිය | 106,387.57 | 29,977.48 |
| සමාගමේ සම්පූර්ණ අදයම | 46,680,733.66 | 57,526,887.01 |
| අඩුකලා මෙහෙයුම් වියදම් | | |
| පරිපාලන වියදම් | 35,069,589.22 | 23,358,619.00 |
| ගමන්  සහ ප්‍රවාහන වියදම් | 2,224,018.77 | 2,197,871.00 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 4,405,670.26 | 25,939,767.00 |
| මෙහෙයුම් කටයුතුවල ශුද්ධ ලාභය (පාඩුව) | 4,981,455.41 | 6,030,630.01 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 516,855.82 | 814,590.00 |
| අදයම් බදු වලට පෙර ශුද්ධ ලාභය (පාඩුව ) | 4,464,599.59 | 5,216,040.01 |

# ANNEXURE 01

## ORGANIZATIONAL CHART

### Ministry of Foreign Employment




- Addl. Secretary - Additional Secretary
- Co. Sec. to Sec. - Coordinating Secretary to the Secretary
- Asst. Secretary. - Assistant Secretary
- A.O. - Administrative Officer
- DO - Development Officer
- DA-Development Assistant
- MA - Management Assistant
- O.E.S. Officers - Office Employees Service

# ANNEXURE 02

## APPROVED CADRE

### Ministry of Foreign Employment

| S/NO | Designation | No of Approved Staff | No of Present Staff | Number of Vacancies |
|---|---|---|---|---|
| 1 | Secretary | 1 | 1 | 0 |
| 2 | Additional Secretary | 2 | 2 | 0 |
| 3 | Senior Assistant Secretary | 2 | 2 | 0 |
| 4 | Chief Accountant | 1 | 1 | 0 |
| 5 | Director (Planning) | 1 | 1 | 0 |
| 6 | Assistant Director | 1 | 0 | 1 |
| 7 | Assistant Secretary | 2 | 1 | 1 |
| 8 | Internal Auditor | 1 | 1 | 0 |
| 9 | Accountant | 1 | 1 | 0 |
| 10 | Administrative Officer | 1 | 1 | 0 |
| 11 | Coordinating Secretary for Secretary | 1 | 1 | 0 |
| 12 | Translator | 2 | 0 | 2 |
| 13 | Development Officer | 1 | 0 | 1 |
| 14 | Development Officer | 1182 | 986 | 196 |
| 15 | Development Assistant | 13 | 6 | 7 |
| 16 | IT Assistant | 1 | 0 | 1 |
| 17 | Management Assistant | 16 | 15 | 1 |
| 18 | Receptionist/Tele.Operator | 1 | 1 | 0 |
| 19 | Still Photographer | 1 | 0 | 1 |
| 20 | Video Cameraman | 1 | 0 | 1 |
| 21 | Video Camera Aide | 1 | 0 | 1 |
| 22 | Driver | 12 | 10 | 2 |
| 23 | KKS | 14 | 14 | 0 |
| | Total | 1259 | 1044 | 215 |

# ANNEXURE 03

## FINANCIAL PERFORMANCE OF THE MINISTRY

### 182- Ministry of Foreign Employment
### Financial Progress as at 2017.12.31

| Object Details | Provision | Expenditure 2017.12.31 | Balance Provision | % Utilized |
|---|---|---|---|---|
| **Recurrent Expenditure** | | | | |
| Personal Emoluments | 503,926,000 | 492,954,187 | 10,971,813 | 98 |
| **Travelling Expenses** | | | | |
| Domestic | 26,300,000 | 22,859,754 | 3,440,246 | 87 |
| Foreign | 17,623,393 | 17,490,589 | 132,804 | 99 |
| Supplies | 22,762,000 | 22,037,171 | 724,829 | 97 |
| Maintenance Expenditure | 14,010,000 | 13,147,533 | 862,467 | 94 |
| Services | 39,362,000 | 37,451,007 | 1,910,993 | 95 |
| Transfers | | | | |
| Property Loan Interest to Public Servants | 500,000 | 491,238 | 8,762 | 98 |
| **Total Recurrent Expenditure** | **624,483,393** | **606,431,480** | **18,051,913** | **97** |
| **Capital Expenditure** | | | | |
| Rehabilitation and Improvement of Capital Assets | 8,900,000 | 4,273,567 | 4,626,433 | 48 |
| Acquisition of Capital Assets | | | | |
| Staff Training | 5,000,000 | 4,502,574 | 497,426 | 90 |
| **Migrant Resource Centre** | | | | |
| Building and Structure | 60,000,000 | 58,502,030 | 1,497,970 | 98 |
| **Total Capital Expenditure** | **129,400,000** | **120,432,087** | **8,967,913** | **93** |
| **Total** | **753,883,393** | **726,863,567** | **27,019,826** | **96** |
| **Public Officers' Advance 'B' Account** | 35,000,000 | 22,657,975 | 12,342,025 | 65 |
| **Grand Total** | **788,883,393** | **749,521,541** | **39,361,852** | **95** |









# ANNEXURE 04

| NO | COUNTRY | COMPANY NAME | JOB CATEGORY | BASIC SALARY | BASIC SALRY RS. | AGE LIMIT | NO OF VACANCY | DEPARTURE CANDIDATES FOR THE YEAR 2017 | BALANCE VACANCIES AS AT 31.12.2017 | BENEFIT | | | | REMARKS |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | FOOD | ACCOM MADATI | MEDICAL | AIR TICKET | |
| 1 | MALAYSIA | SIME DARDY PLANTATION | PLANTATION WORKER | RM1000 | 35,436.00 | 18 - 45 | 500 | 37 | 213 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| 2 | SINGAPORE | ENVOY INTERNATIONAL LLP | HOUSE MAID | SD450 - SD550 | 48,600 - 59,400 | 23 - 38 | 50 | 1 | 45 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| 3 | KUWAIT | CITY GROUP CO | BUS DRIVER | KD152 | 73,720.00 | 25 - 45 | 100 | 2 | 98 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| 4 | SINGAPORE | HOMEKEEPER INTERNATIONAL PTE LTD | HOUS MAID | SD500 | ######## | 23-38 | 50 | 0 | 50 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| 5 | ISRAEL | POPULATION & IMMIGRATION BOARDER AUTHORITY | AGRICULTURE WORKER | NIS 4300 | 150,000.00 | 25-39 | 500 | 529 | AL/1500/4/17 - BALANCE 92 AL/1500/16/17- BALANCE 498 | x | √ | √ | x | |
| 6 | JORDAN | ASEEL GARMENT | MACHINE OPERATORS | US$ 155 | 22,940.00 | 22-35 | 250 | 0 | 250 | √ | √ | √ | √ | |
| | | | CUTTING/LINE/PACKING HELPERS | US$ 155 | 22,940.00 | 22-35 | 50 | 0 | 50 | √ | √ | √ | √ | |
| | | | FINAL CHECKER | US$ 155 | 22,940.00 | 22-35 | 40 | 0 | 40 | √ | √ | √ | √ | |
| | | | IRON OPERATOR | US$ 155 | 22,940.00 | 22-35 | 20 | 0 | 20 | √ | √ | √ | √ | |
| | | | LINE SUPERVISOR | US$ 400 | 59,200.00 | 22-35 | 10 | 0 | 10 | √ | √ | √ | √ | |
| | | | CUTTER | US$ 350 | 51,800.00 | 22-35 | 10 | 0 | 10 | √ | √ | √ | √ | |
| | | | MECHANICS | US$ 350 | 51,800.00 | 22-35 | 5 | 0 | 5 | √ | √ | √ | √ | |
| | | | QUALITY CONTROLLER | US$ 300 | 44,400.00 | 22-35 | 15 | 0 | 15 | √ | √ | √ | √ | |
| | | | PRODUCTION IN CHARGE | US$ 750 | 111,000.00 | 22-35 | 5 | 0 | 5 | √ | √ | √ | √ | |

| NO | COUNTRY | COMPANY NAME | JOB CATEGORY | BASIC SALARY | BASIC SALRY RS. | AGE LIMIT | NO OF VACANCY | DEPARTURE CANDIDATES FOR THE YEAR 2017 | BALANCE VACANCIES AS AT 31.12.2017 | BENEFIT | | | | REMARKS |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | FOOD | ACCOM MADATI | MEDICAL | AIR TICKET | |
| 7 | MALDIVES | PNEUMATIC PRIVATE | MOTOR WINDERS (GR 6) | US$ 600 | 88,800.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | LIMITED | MOTOR WINDERS (GR 3) | US$450 | 67,950.00 | 25-45 | 2 | 2 | 0 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | MOTOR WINDERS (GR 6) | US$450 | 67,950.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | MOTOR WINDERS (GR 3) | US$450 | 67,950.00 | 25-45 | 2 | 0 | 0 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | MECHANICAL ENGINEER | US$ 800 | 118,400.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | MECHANICAL ENGINEER | US$450 | 67,950.00 | 25-45 | 4 | 0 | 4 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | WELDER-GENERAL | US$450 | 67,950.00 | 25-45 | 3 | 0 | 3 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | LATHEMAN | US$450 | 67,950.00 | 25-45 | 1 | 0 | 1 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | ASST. GENERAL DUTY | US$450 | 67,950.00 | 25-45 | 1 | 0 | 1 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | STOREKEEPER | US$450 | 67,950.00 | 25-45 | 1 | 0 | 1 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | SALES EXECUTIVE | US$500 | 75,500.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | ASST. ACCOUNTANT | US$700 | 105,700.00 | 25-45 | 1 | 1 | 0 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | SURVEYOR - QUANTITY | US$700 | 105,700.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | DRAUGHTSMAN - GENERAL | US$700 | 105,700.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | TINKER | US$450 | 67,950.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | MECHANIC -GENERAL | US$450 | 67,950.00 | 25-45 | 2 | 1 | 1 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | AUTO ELECTRICIAN | US$450 | 67,950.00 | 25-45 | 3 | 1 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | TECHNICIAN - ELECTRICIAL | US$450 | 67,950.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | ENGINEER - ELECTRICAL | US$650 | 98,150.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | ASSISTANT ENGINEER | US$500 | 75,500.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | OFFICER - TECHNICAL | US$500 | 75,500.00 | 25-45 | 5 | 0 | 5 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | OFFICER TECHNICAL | US$500 | 75,500.00 | 25-45 | 5 | 0 | 5 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | OFFICER - TECHNICAL | US$500 | 75,500.00 | 25-45 | 5 | 0 | 5 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | ENGINEER - DESIGN | US$800 | 120,800.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| | | | ASST. CIVIL ENGINEER | US$1000 | 151,000.00 | 25-45 | 2 | 0 | 2 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| 8 | OMAN | FASHION APPERAL | MACHINE OPERATORS | OMR 118 | 45,902.00 | 21-32 | 100 | 2 | 98 | √ | √ | √ | √ | |
| | | | SENIOR QUALITY CHECKER | OMR 162 | 63,018.00 | | 2 | 0 | 2 | √ | √ | √ | √ | |
| | | | FINISHING QUALITY CHECKER | OMR 143 | 55,627.00 | | 2 | 0 | 2 | √ | √ | √ | √ | |
| | | | ROVING QUALITY CHECKER | OMR 144 | 56,016.00 | | 2 | 0 | 2 | √ | √ | √ | √ | |
| | | | PRODUCTION SUPERVISOR | OMR 163 | 63,407.00 | | 2 | 0 | 2 | √ | √ | √ | √ | |
| 9 | BAHRAIN | YOUSIF MANPOWER | HOUSEMAID (WITHOUT EXPERIENCE) | BD 120 | 48,120.00 | 25-39 | 25 | 0 | 25 | √ | √ | √ | FREE OF CHARGE | |
| | | SERVICES | HOUSEMAID (WITH EXPERIENCE) | BD 140 | 56,140.00 | | 25 | 0 | 25 | √ | √ | √ | FREE OF CHARGE | |
| | | | HOUSEDRIVER | BD 170 | 68,170.00 | | 10 | 0 | 10 | √ | √ | √ | RETURN TICKET ONLY | |
| 10 | DUBAI | TAKENAKA MIDDLE EAST LLC | LABOUR | DHS1500 | 63,000.00 | 20-35 | 2 | 2 | 0 | √ | √ | √ | FREE OF CHARGE | |
| | | | PRODUCTION LEADER | DHS3500 | 147,000.00 | 20-35 | 1 | 1 | 0 | √ | √ | √ | FREE OF CHARGE | |

**Ministry of Foreign Employment**
51/2/1, 2nd Floor, Asset Arcade Building, York Street, Colombo 01.
Email - secretary@mfe.gov.lk
Telephone: +94112331336, +94112330307, +94112331250 Fax: +94112330069

**www.mfe.gov.lk**